# බස්නාහිර පළාතේ පළාත් සභාව
## மேல் மாகாண மாகாண சபை
## WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**2012 ඔක්තෝබර් 09 වන අඟහරුවාදා**

2012 ஒக்டோபர் 09 செவ்வாய்க்கிழமை

Tuesday 09th October 2012

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාත් සභා නව ගොඩනැගිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවති සභා රැස්වීම**

பத்தரமுல்ல, ஸ்ரீ ஜயவர்த்தனபுர, டென்சில் கொப்பேகடுவ மாவத்தை, இல.204 இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்.

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09.50 පළාත් සභාව රැස් විය.**

*மு.ப.09.50 க்கு சபை கூடியது*

*The Provincial Council met at 09.50 a.m.*

**ගරු සභාපතිතුමා [ සුනිල් විජේරත්න මහතා ] මූලාසනාරූඪ විය.**

*திரு. தவிசாளர்[ சுனில் விஜேரத்ன அவர்கள்] தலைமை வகித்தார்.*

*Mr. Chairman [ Sunil Wijerathne ] in the Chair*

# සභාපතිවරයාගේ නිවේදනය
## ANNOUNCEMENT OF CHAIRMAN

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

"*කාර්ය පටිපාටි රීති 86 (4) හි විධිවිධාන අනුව 2012.09.20 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි නලින්ද චජිරමාල් ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා සභා කටයුතු පිළිබඳ කාරක සභාවේ සාමාජිකයෙකු වශයෙන් හා ගෘහ කාරක සභාවේ සාමාජිකයෙකු වශයෙන්ද මා විසින් නම් කරනු ලැබ ඇති බව කාරුණිකව දැනුම් දෙනවා.*"

# පෙත්සම්
## PETITIONS

**ගරු අජිත් මාන්නප්පෙරුම**
Hon. Ajith Mannaperuma

ගරු සභාපතිතුමනි, ගම්පහ, ආනන්ද මාවත, අංක 37 හි පදිංචි යූ.එන්. නානායක්කාර යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

***[සභා මේසය මත තබන ලද පෙත්සම]**
*[Tabled petition]*

ආනන්ද රංජිත් රූපසිංහ ගරු මන්ත්‍රීතුමාගේ අත්සනින් යුත්,

ගම්පහ, ආනන්ද මාවත, අංක 37 හි පදිංචි යූ.එන්. නානායක්කාර යන අයගේ පෙත්සම.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් කාරක සභාවට යොමු කළ යුතු යැයි නියෝග කරන ලදී.***

*Petitions Presented, ordered to refer to the Petitions committee*

# අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ
## MINISTRIES ' ANNOUCEMENTS/ MINISTERS ' STATEMENTS

**ගරු ජගත් අංගගේ** (සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන හා කාන්තා කටයුතු, පරිවාස හා ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යතුමා)
Hon. Jagath Angage (Minister of Health, Indigenous Medicine, Social Welfare and Women's Affairs , Probation and Child Care Services and Council Affairs)

ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාත් සභාවේ සමාජ සේවා අමාත්‍යාංශය විසින් පවත්වනු ලබන සමාජ සත්කාරක සතිය පිළිබඳව සභාවට ප්‍රකාශයක් කිරීමටයි ඔබතුමාගෙන් අවස්ථාව අපේක්ෂා කර සිටියේ. මොකද, මෙම කටයුත්තට දායක වුණු අපේ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ටත්, ඒ වාගේම මේ සඳහා ප්‍රජා දායකත්වය ලබා දුන් බස්නාහිර පළාතේ ජනතාවටත්, ඒ වාගේම මේ කටයුත්තට අතහිත දුන් පළාත් සභාවේ මගේ සහෝදර ගරු මන්ත්‍රීවරුන්ටත් ස්තුතිය ප්‍රකාශ කිරීමට මෙය අවස්ථාවක් කර ගැනීමට මා අදහස් කරනවා.

ගරු සභාපතිතුමනි, 2012 වර්ෂයේ සැප්තැම්බර් මස 17 වැනිදා සිට 23 වැනි දින දක්වා බස්නාහිර පළාතේ මේ සමාජ සත්කාරක සතිය පළාතේ දිස්ත්‍රික්ක තුනේ විවිධ ස්ථානවලදී පැවැත්වුවා. මෙහිදී සුව සෙවණ ව්‍යාපෘතිය, අසරණ සරණ වැඩ සටහන, දූ පුතු මා පිය වැඩ සටහන, රන් දා බිඳු සහ අපේ සොඳුරු පවුල වැඩ සටහන අපි ක්‍රියාත්මක කිරීම තුළින් බස්නාහිර පළාතට අත්පත් කර ගත් ජයග්‍රහණ පිළිබඳව පැහැදිලි කිරීමක් මෙම සභාවට කිරීම අතිශයින්ම වැදගත් කාරණාවක් හැටියට මම සලකනවා. මොකද, මෙහිදී අපත් සමග සම්බන්ධ වෙලා කටයුතු කරපු ගරු මන්ත්‍රීතුමන්ලා අතිශයින්ම මේ සඳහා යහපත් වූ දායකත්වයක් ලබා දුන්නා. ඒ දිරිගැන්වීම සහ ඔහුන් කරන ලද මග පෙන්වීම මා ඉතාමත් අගය කොට සලකනවා. ගරු සභාපතිතුමනි, අපි 2011.09.17 සිට 2012.09.23 දක්වා වර්ෂයක කාලයක් තුළ මේ සඳහා ආයෝජනය කළ මුදල සහ ඒ තුළින් ලබා ගත් ප්‍රතිලාභයන් පිළිබඳව පැහැදිලි කිරීමක් කිරීම මම හිතනවා අත්‍යවශ්‍ය වෙනවාය කියලා. අපි බිලියන 3.25 ක මුදලක් 2011 සමාජ සත්කාරක සතිය වෙනුවෙන් ඒකාබද්ධ අරමුදලින් වැය කර තිබෙනවා. අපි පසුගිය වසරේ ජයග්‍රහණ හැටියට දකින්නේ, මිලියන 273 ක ප්‍රතිලාභයක්, බස්නාහිර පළාතේ ප්‍රජාවගේ දායකත්වය යටතේ ලැබුණු ප්‍රජා දායකත්වය හැටියට පසුගිය වසරේ ගණනය කර තිබෙනවා. 2012.09.24 වන දින සිට 2013.09.17දක්වා වර්ෂය තුළ 2011 සමාජ සත්කාරක සතිය වෙනුවෙන් ඒකාබද්ධ අරමුදලින් අපි වැය කළ මුදල රුපියල් මිලියන 2.75 කට ආසන්න වෙනවා. අපි අපේක්ෂිත ප්‍රජා දායකත්වය ඉදිරි වර්ෂය තුළ මිලියන 438 ක්. මෙම වැඩ සටහන් පිළිබඳව අප දත්ත ඒකරාශී කර ගැනීම සහ බස්නාහිර පළාතේ

සමාජ ගැටළු අවබෝධ කර ගැනීම සඳහා අංශ කිහිපයකින් මේ රටේ විශ්ව විද්‍යාල පද්ධතිය තුළ සිටින විද්වතුන් සහ එක එක සමාජ ගැටළු තුළ අලුතින් ගැබ් ගෙන ඇති ප්‍රශ්න පිළිබඳව

[ ගරු ජගත් අංගගේ - අමාත්‍යතුමා ]

මාසිකව එක් එක් විෂයය සම්බන්ධව මේ රටේ විද්වතුන් සමග විවිධ මාතෘකා යටතේ කරන ලද සාකච්ඡාමය අවස්ථාවන් සහ ප්‍රයෝගිකව කරන ලද සමීක්ෂණ, තොරතුරු අනුව මේ ප්‍රදේශය තුළ අපචාර වැඩිවීමට සිදු වී ඇති කාරණා, බන්ධනාගාරගත වන ප්‍රමාණය වැඩි වීම, මත්ද්‍රව්‍ය භාවිතය වැඩි වීම, වැඩිහිටි අනාථ අසරණ පිරිස් නිවාසගත වීමේ ප්‍රශ්නය, ආබාධ සහිත අය නිවාසගත වීමේ ප්‍රවණතාවය වැඩි වීම, මන්ද මානසික සහ ඔඩිසන් තත්ත්වයේ දරුවන් ඉපදෙන ප්‍රමාණය වැඩි වීම, ළමා මවුරුවන් ක්‍රමිකව වැඩි වීම, අවුරුද්දකට අඩු විවාහ දික්කසාද වීම් වැඩි වීම, පොදුවේ දික්කසාද වීම් වැඩි වීම, දිළිඳු පවුල් වැඩි වීම, සමාජ ආරවුල් වැඩි වීම ආදී වශයෙන් විවිධ මාතෘකා යටතේ මේ පිළිබඳව පරීක්ෂණ සහ ගවේෂණවල යෙදී සිටින විද්වතුන් සමග මාසිකව නිරන්තරයෙන් මේ වර්ෂය පුරාම එක් දිනක් පවත්වන ලද විවිධ මට්ටමේ සාකච්ඡාවල ප්‍රතිඵල හැටියට, ඒකරාශී කර ගත් දත්ත අනුව මෙම සමාජ පසුබිම නිවැරැදි කිරීම සඳහා දැවැන්ත මෙහෙවරක යෙදී තිබෙනවා. 2013 වර්ෂයේ අපේ සොඳුරු පවුල කියන ව්‍යාපෘතිය තුළින් සමස්ත බස්නාහිර පළාතේ ගම්මානවලට රැගෙන ගිහිල්ලා මෙකී ප්‍රශ්නවලින් තොර ගම්මාන නිර්මාණය කිරීම සඳහා සමාජයේ යම් පරිවර්තනයක් ඇති කරන්න මහ දැවැන්ත කාර්ය භාරයක් මේ අමාත්‍යාංශය තුළින් ඉෂ්ට කරන්න අපි අපේක්ෂා කරනවා. මෙය ඉෂ්ට කිරීමේදී බස්නාහිර පළාතේ මූලික අරමුදල්ම අපි පදනම් කරගෙන නැහැ. මා කලින් පැහැදිලි කළා, අප විසින් බස්නාහිර පළාතෙන් ආයෝජනය කළ මුදල් සහ ප්‍රතිලාභ වශයෙන් ගිය අවුරුද්දේ ලබා ගත් ප්‍රජා දායකත්වය පිළිබඳව. 2011.09.17 සිට 2012.09.23 දක්වා කාල පරිච්ඡේදය තුළ අපි කරපු මෙහෙයුමේදී පළාත් සභාවෙන් ආයෝජනය කළ මුදල රුපියල් මිලියන 3.22 කට ආසන්න ප්‍රමාණයක් වෙනවා. එයින් ලබාගත් ප්‍රතිලාභ ප්‍රමාණය මිලියන 273 ක්. මේවා පිළිබඳව වෙන වෙනම ගණන් මිනුම් මට අවශ්‍ය නම් සභාවට ඉදිරිපත් කරන්න පුළුවන්, ඒ මිලියන 273 ට අපි ප්‍රජා දායක්තවය ලබා ගත්තේ කොයි ආකාරයෙන්ද කියන එක පිළිබඳව.

ගරු සභාපතිතුමනි, ලබන වසරේදී මෙහි ප්‍රජා දායකත්වය අපි අපේක්ෂා කරනවා, මිලියන 438 ක්. මෙය ලැබෙන්නේ කොහොමද කියලා මට අවශ්‍ය මොහොතකදී සභාවට පැහැදිලි කිරීම් කරන්න පුළුවන්. දැනට අපි මේ ව්‍යාපෘතිය සඳහා ආයෝජනය කරලා තිබෙන්නේ, මිලියන 2.75 ක්. මේවායේ පුංචි පුංචි ගැටළු අපට අහන්න ලැබෙන නිසා මේ සඳහා කැප වී සිටින නිලධාරි කණ්ඩායමට විවිධ අවස්ථාවලදී, විවිධ සමාජ ගැටළුවලට මුහුණ දෙන්න සිදු වුණා. නින්දා, පරිභව විඳ ගන්න සිද්ධ වුණා. ඒ අයට දැඩි ලෙස මානසික වශයෙන් අපහසුතාවයට පත් වන අවස්ථා තිබුණා, මේ සමාජ ප්‍රශ්න, මේ සමාජ ගැටළුත් එක්ක හැසිරෙන අවස්ථාවලදී. ඒ නිසා මම විශේෂයෙන්ම පැහැදිලි කිරීමකට අවස්ථාව ලබා ගත්තේ, ඒ කාරණා පදනම් කරගෙන. මොකද, වැඩ කරන නිලධාරීන්ගේ රැකවරණය සැලසීම අමාත්‍යාංශය, දෙපාර්තමේන්තුව භාර අමාත්‍යවරයා හැටියට මගේ වගකීමක් නිසා මේ පිළිබඳ පැහැදිලි කිරීමක් කිරීම මගේ යුතුකමක්. ඒ වාගේම ඒ සඳහා අපට ආශිර්වාද කරපු, ඒ උත්සව කටයුතුවලට සහ ඒ වැඩ කටයුතුවලට දායකත්වය ලබා දුන්නු උපදේශක කාරක සභාවේ සහ ඉන් බැහැර ගරු මන්ත්‍රී කණ්ඩායමකුත් මේ සභාව තුළ ඉන්නවා. ඒ අයට මගේ ගෞරවය සහ ප්‍රශංසාව පුද කරන්නත් මා මෙය අවස්ථාවක් කර ගන්නවා. මා විශේෂයෙන්ම අධ්‍යාපන අමාත්‍යාංශයටත්, ගරු ප්‍රධාන ඇමැතිතුමාටත් මේ වර්ෂයේදී අපට ලබා දෙන්න ඉදිරිපත් වූ දායකත්වය පිළිබඳව අපි දැඩි ලෙස අපේ ගෞරවය සහ ස්තුතිය පුද කරනවා. මේ වර්ෂයේ බස්නාහිර පළාතේ පළාත් සභාවේ අධ්‍යාපන අමාත්‍යාංශය පාසල් මට්ටමින් එක් පාසලකින් එක් නිවස බැගින් නිවාස 100 ක් ඉදි කිරීම සඳහා ඒ පාසල් පද්ධතියේ විදුහල්පතිවරුන් සහ ඒ දරුවන්, ආචාර්ය මණ්ඩලය අද අපත් සමග අත්වැල් බැඳගෙන සිටිනවා. ඒ නිසා ඒ තුළ මිලියන 100 ක ප්‍රතිලාභයක් අපි අපේක්ෂා කරනවා. මෙවන් ආකාරයෙන් විවිධ සමාජ තලවල සිටින විද්වතුන් සහ ශ්‍රම දායකත්වය තුළින් ලබා දුන් සහයෝගය, විවිධ මට්ටමෙන් ආශිර්වාදාත්මකව ලබා දුන් සහයෝගය අතිශයින්ම අපේ නිලධාරී කණ්ඩායටම ඒ වාගේම මේ බස්නාහිර පළාතේ සම්පත් දායකයින් හැටියට අපට ප්‍රජාව සවිබල ගැන්වීමට ශක්තිය දුන් සියලුම දානපතියන්ට සහ ඔවුන් සමග එක්ව අත්වැල් බැඳ ගත්තු සියලු දෙනාට මගේ ගෞරවය සහ ප්‍රණාමය ගරු සභාපතිතුමනි, මේ අවස්ථාවේ පුද කරන්න මා මෙය අවස්ථාවක් කර ගන්නවා. මම සියලු දෙනාට ආරාධනා කරනවා මේ වැඩ පිළිවෙළ සමග එකතු වෙලා බස්නාහිර පළාතේ පවතින අතිශයින්ම වැදගත් වූ සමාජ ප්‍රශ්න, ගැටළු විසඳා ගැනීම සඳහා අපි එකතු වෙලා කටයුතු කරමුයි කියලා. නැවතත් ගරු සභාපතිතුමනි, ඔබතුමා ඇතුළු සියලු දෙනාට මගේ ගෞරවය සහ ආචාරය පුද කරමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

# පෞද්ගලික පැහැදිලි කිරීම්
## PERSONAL EXPLANATIONS

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** (කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත සහ පරිසර කටයුතු අමාත්‍යතුමා)

Hon. Udaya Prabhath Gammanpila (Minister of Agriculture, Agrarian Development, Minor Irrigation, Industries and Environmental Affairs.)

ගරු සභාපතිතුමනි, ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක මුල්ගල් තුන වන්නේ අධිකරණය, ව්‍යවස්ථාදායකය සහ විධායකයයි. අපි දන්නවා, ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක් පවතින්න නම් ජනතා පරමාධිත්වය ක්‍රියාත්මක කරන මේ ආයතන තුනම ශක්තිමත් වෙන්න ඕනෑ. ස්වාධීන වෙන්න ඕනෑ. ඒ ආයතනවලට ස්වාධීනව කටයුතු කිරීමේ පසුබිමක් තිබෙන්න ඕනෑ. මේ ආයතන තුනේම බලයේ උල්පත ජනතා පරමාධිත්වයයි. ඒ නිසා මේ ආයතන ක්‍රියාත්මක කරන්නේ, ජනතාව විසින් ලබා දෙන ලද

බලයයි. මේ ආයතනවලට යම් කරදරයක් වෙනවා කියන්නේ, මේ ආයතනවලට යම් බලපෑමක් වෙනවා කියන්නේ ජනතා පරමාධිත්වය අභියෝගයට ලක් වෙනවා කියන කාරණයයි. ගරු සභාපතිතුමනි, ප්‍රජාතන්ත්‍රවාදී සමාජය ඉදිරියට යන්න විධායකය, අධිකරණය සහ ව්‍යවස්ථාදායකත්වය ස්වාධීනව කටයුතු කළ යුතුවා සේම එකිනෙකා අතර සහයෝගයෙන් කටයුතු කරන්න ඕනෑ. නමුත් අවාසනාවට මෑත කාලයේ මේ ආයතන තුන අතර අනවබෝධයක් මතු වෙලා තිබෙනවා. මේ ආයතන තුන අතරම අනවබෝධයක් මතු වීම සමහරුන්ට කුරිරු සතුටක්, වින්දනයක් ලබා දීමට හේතුවක් වෙන්න පුළුවන්. නමුත් ගරු සභාපතිතුමනි, මේ රට අස්ථාවර වීමට සිදු විය හැකි භයානකම තර්ජනය වන්නේ, මේ ආයතන තුන අතර අනවබෝධයක් ඇති වීමයි. අපි අතර ශ්‍රී ලංකාකාරයෝ ඉන්නවා වෙන්න පුළුවන්. UNP කාරයෝ, JVP කාරයෝ, කොමිනිස්ට්කාරයෝ, හෙළ උරුමකාරයෝ ඉන්නවා වෙන්න පුළුවන්. නමුත් ඔය හැම පක්ෂයක්ම අපට අයිති වෙන්න කලින් අපි ශ්‍රී ලාංකිකයෝ වෙලා උපන්නේ. අපේ රටට අර්බුදයක්, තර්ජනයක් ඇති වෙනවා නම් පක්ෂ භේද පැත්තක තියලා අපි මේ අර්බුදය ගැන පක්ෂ භේදයෙන් ඔබ්බට ගිහිල්ලා බලන්න පුළුවන් වෙන්න ඕනෑ. ගරු සභාපතිතුමනි, බටහිර බලවේග ආණ්ඩුවක් පරාජය කරන්න උවමනා වුණාම තුන්වැනි ලෝකය පුරාම බලවේග තුනක් පාවිච්චි කරලා තිබෙනවා.

**ගරු යූ. ජෝර්  පෙරේරා –** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

බටහිර බලවේගය ?

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල –** අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ඔබතුමා මට ඇහුම්කන් දෙන්න. ඔබතුමාටත් උත්තර දෙන්න පුළුවන්. (බාධා කිරීම්)

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

බටහිර බලවේග නොවෙයි. රාජපක්ෂ බලවේගය –

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ජෝර්ජ් පෙරේරා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා, ඔබතුමා බාධා කිරීම් කරන්න එපා.

**ගරු යූ. ජෝර්  පෙරේරා –** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ඔය ප්‍රශ්නය ඔබතුමා ඉස්සර වෙන්න දාගත්තේ. විපක්ෂයෙන් කථා කළ යුතු දෙයක්. ඔබතුමා මොකද ඉස්සර වුණේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර ඔබතුමා වාඩි වෙන්න.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල –** අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු සභාපතිතුමනි, –

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පෞද්ගලික පැහැදිලි කිරීම්වලට පුංචි කාලයක් තියෙන්නේ. ඒ නිසා බාධා කිරීම් කරන්න එපා.

**ගරු යූ. ජෝර්  පෙරේරා –** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

අධිකරණයට ගහලා. කථා කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විපක්ෂ සංවිධායකතුමා, ඔබතුමා වාඩි වෙන්න. බාධා කිරීම් කරන්න එපා.

[සභාවේ ඝෝෂා]

කරුණාකර සභාව නිශ්ශබ්ද වෙන්න.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල –** අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු සභාපතිතුමනි, පළාත් සභාවේ රීතිවල ඉතා පැහැදිලිව සඳහන් කරලා තිබෙනවා, පෞද්ගලික පැහැදිලි කිරීම්වලට බාධා කරන්න බැහැයි කියලා. රීති දන්න විපක්ෂයේ සංවිධායකවරයෙක් අපට ලැබේවා කියලා ප්‍රාර්ථනා කරමින්, මම ඉදිරියට යනවා. ගරු සභාපතිතුමනි, මම සඳහන් කරමින් හිටියේ බටහිර බලවේග –

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

බටහිර නොවෙයි –

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල –** අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

තුන්වැනි ලෝකයේ ආණ්ඩු පෙරළන්න – (බාධා කිරීම්) තිත්ත ඇත්තයි. ඒත් ඇත්ත තිත්ත කරුණාකරලා අහගෙන ඉන්න. බලවේග හුහක් පාවිච්චි කරලා තිබෙනවා. පළමුවැනි බලවේගය –

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා සභාව නිශ්ශබ්ද වෙන්න.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල - අමාත්‍යතුමා**
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු සභාපතිතුමනි, සභාව නිශ්ශබ්ද කරලා දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා සභාව නිශ්ශබ්ද වෙන්න. බාධා කිරීම් කරන්න එපා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

සභාවට බොරු කියනවා නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පෞද්ගලික පැහැදිලි කිරීම්වලට බොහොම පුංචි කාලයක් තියෙන්නේ. විනාඩි 03, 04, 05 යි තියෙන්නේ. ඔබතුමන්ලාටත් අවස්ථාවක් තිබෙනවා පිළිතුරු දෙන්න. විපක්ෂයට කාලය වෙන්න කරලා තියෙන්නේ. ඒ නිසා ඒ කාලයේදී ඔබතුමන්ලා මේ ගැන කථා කරන්න. බාධා කිරීම් කරන්න එපා. ඔබතුමා කථා කරන්න.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල - අමාත්‍යතුමා**
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු සභාපතිතුමනි, ඇමරිකා එක්සත් ජනපදය 1953 දී ඉරානයේ ප්‍රගතිශීලී අගමැති මොහොමඩ් මොසටෙක්ගේ ආණ්ඩුව පෙරලන්න පාවිච්චි කළේ, පාවිච්චි කරන්න පුළුවන් පළමුවැනි සහ ප්‍රධානම බලවේගය වූ විපක්ෂය. නමුත් ලංකාවේ විපක්ෂය පාවිච්චි කරලා ආණ්ඩු පෙරලන්න බැහැයි කියන කාරණය පසුගිය මැතිවරණවලදී ඉතාම පැහැදිලිව ඔප්පු වුණා. ඊළඟට බටහිර බලවේග තුන්වැනි ලෝකයේ රටවල ආණ්ඩු පෙරලන්න පාවිච්චි කළේ හමුදාව. (බාධා කිරීම්) 1979 -

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බාධා කිරීම් කරන්න එපා. කරුණාකරලා නිශ්ශබ්ද වෙන්න. ඔබතුමන්ලාට විනාඩි 10 ක කාලයක් තිබෙනවා. එතුමාට අදහස් ප්‍රකාශ කරන්න ඉඩ දෙන්න.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල - අමාත්‍යතුමා**
Hon. Udaya Prabhath Gammanpila - Minister

1979 දී පකිස්ථානයේ ආණ්ඩුව පෙරලන්න හමුදාව භාවිතා කිරීමෙන් බටහිර බලවේග භාවිතා කරන දෙවැනි බලවේගය බවට හමුදාව පත් වුණා. ඒ වාගේම පකිස්ථානයේ ඊජිප්තුවේ ආණ්ඩු පෙරලන්න භාවිතා වුණේ අධිකරණය. ඒ නිසා -

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

අධිකරණයට ගහලා තියෙන්නේ බටහිර බලවේග ඇවිල්ලා.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල - අමාත්‍යතුමා**
Hon. Udaya Prabhath Gammanpila - Minister

මේ බලවේග අතර ගැටුමක් ඇති වීම අනිවාර්යයෙන්ම සමාජයට බලපෑමක් වෙනවා ගරු සභාපතිතුමනි. මෙවැනි -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර බාධා කිරීම් කරන්න එපා.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ගල්කිස්සේදී ගැහුවේ බටහිර බලවේගද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බාධා කිරීම් කරන්න එපා. ඔබතුමාගේ කථාවේදී කියන්න. කාලය දීලා තිබෙනවා.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

රෙද්දක් ඇඳගෙනද කථා කරන්නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා එතුමාට බාධා කිරීම් කරන්න එපා.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල - අමාත්‍යතුමා**
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු සභාපතිතුමනි, මේ කථා කරන දේවල් ගැන අහගෙන ඉන්න මේ අයට කොන්දක් නැහැ. මේවාට උත්තර නැහැ. ඒ නිසා ඇත්ත යටපත් කරන්න හදන්නේ. කරුණාකරලා -

[සභාවේ ඝෝෂා]

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක**
Hon. U. George Perera - Chief Opposition Whip

මහ ඇමැතිතුමා කිව්වා නම් දුක නැහැ. ඔබතුමා රෙද්දක් ඇඳගෙනද කථා කරන්නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විපක්ෂයේ සංවිධායකතුමා ඔබතුමා දිගින් දිගටම බාධා කිරීම් කරන්න එපා.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල - අමාත්‍යතුමා**
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු සභාපතිතුමනි, මට මේ ප්‍රකාශය කිරීමට අවශ්‍යයි. කරුණාකරලා මට මේ සභාව නිශ්ශබ්ද කරලා දෙන්න. මේ ප්‍රකාශය කරලා ඉවර වෙලයි අද මම කථාව අවසන් කරන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමන්ලා පොඩ්ඩක් නිශ්ශබ්ද වෙන්න. පෞද්ගලික පැහැදිලි කිරීම්වලට බාධා කිරීම් කරන්න එපා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, රීති ප්‍රශ්නයක් තියෙනවා.

**ගරු නිමල් ලාන්සා** (මාර්ග සංවර්ධන, සත්ව නිෂ්පාදන හා සංවර්ධන, නිවාස හා ඉදි කිරීම්, ධීවර හා සංචාරක අමාත්‍යතුමා)
Hon. Nimal Lansa - (Minister of Road Development, Animal Production and Development, Housing and Construction, Fisheries and Tourism)

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

**ගරු එම්.එම්.එම්. අම්ජාඩ්**
Hon. M.M.M. Amjad

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

**ගරු නිමල් ලාන්සා** – අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රීතිය කියන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මේක ඔබතුමාට පෙන්වන්න අවස්ථාව ලබා දෙන්න.

**ගරු නිමල් ලාන්සා** – අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

36 (1).

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

36 (1) රීති නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

34, ගරු සභාපතිතුමනි. මේ උදය ගම්මන්පිල ගරු ඇමැතිතුමා –

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා රීති ප්‍රශ්නය කියන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

34 රීතිය ගැන. පෞද්ගලික පැහැදිලි කිරීම් ගැන පසුගිය පළාත් සභා රැස්වීමේදී මෙතුමා විග්‍රහයක් කළා. එතුමාගේ විග්‍රහයම ඔබතුමාට කියවන්න පුළුවන්. හැන්සාඩ් එකේ 23 වැනි පිටුවේ –

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමා සභාව නොමග අරින්න එපා. 34 එහෙම රීතියක් නැහැ. ඔබතුමා වරින් වර සභාව නොමඟ අරිනවා. ඔබතුමා කරුණාකර වාඩි වෙන්න.

[සභාවේ ඝෝෂා]

ඔබතුමා සභාව නොමග අරින්න එපා. සභාව විහිළුවක් කරන්න එපා. ඔබතුමා හරි ප්‍රශ්නයක්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, මගේ ප්‍රශ්නය මේකයි. මෙතුමා ප්‍රකාශ කරලා තිබෙනවා –

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, සභාවේ රීතියක් තියෙනවා. ඔබතුමා කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, 36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා මූලාසනයට ගරු කරලා කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මෙතුමා සභාවට බොරු කියනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා ඔබතුමා වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මේ එතුමාගේ ප්‍රකාශයක් ගැන මම කියන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

34 රීතියේ එහෙම ප්‍රශ්නයක් නොවෙයි තියෙන්නේ. 34 රීතියේ පෞද්ගලික පැහැදිලි කිරීම් තියෙන්නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මගේ වරප්‍රසාදය 36 (1). එතුමා කථා කරන්නේ 34 රීතිය. ඒකයි කිව්වේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර වාඩි වෙන්න. ඔබතුමා වරින් වර මේ සභාව නොමඟ අරින්න එපා. හැම තිස්සේම ඔබතුමාට මේ වැඩේ කරන්න දෙන්න බැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම සභාව නොමඟ යවන්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා 34 කියලා වෙනත් දේවල් කථා කරන්නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මගේ වරප්‍රසාද ප්‍රශ්නය 36 (1). ගරු සභාපතිතුමනි, මට 36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තියෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කලින් 34 ගැන නේ කිව්වේ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

නැහැ, නැහැ. මම කිව්වේ මෙතුමා කථා කළේ 34 ගැන.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා මේ සභාව විහිළුවක් කරන්න එපා. හැමදාම ප්‍රශ්න ඇති කරනවා. 34 කියලා. ආයිත් 36 (1) කියනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමා අපට කථා කරන්න -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා කරුණාකරලා ඔබතුමා නිශ්ශබ්ද වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

හැන්සාඩ් එකේ 23 වැනි පිටුවේ තියෙන්නේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එතකොට වරප්‍රසාද ප්‍රශ්නය අහන්න දෙන්නේ නැද්ද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා ඔබතුමා පොඩ්ඩක් වාඩි වෙන්න.

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

ගරු සභාපතිතුමනි, 36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්. දිගින් දිගටම සභාවේ මූලාසනයට යම් මන්ත්‍රීවරයෙක් අවනත නොවෙනවා නම්, අනෙක් මන්ත්‍රීවරුන්ගේ වරප්‍රසාද උල්ලංඝණය වෙනවා. මේ ආකාරයෙන් මේ සභාවේ වැඩ කරන්න බැහැ. එක්කෝ ඔබතුමා මේ වෙලාවේ ඒ මන්ත්‍රීවරයා පිළිබඳව තීන්දුවක් ගන්න. එහෙම නැත්නම් මේ සභාව කල් තබන ලෙස කරුණාවෙන් ඉල්ලා සිටිනවා. මේ විධියට සභාවක් ගෙනියන්න බැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමා මම කියන දේට පොඩ්ඩක් සවන් දෙන්න. ඔබතුමා 34 කියලා දැන් වෙන රීතියක් කථා කරන්නේ.

34 රීතියේ එහෙම එකක් නැහැ. පෞද්ගලික පැහැදිලි කිරීම් තියෙන්නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම කිව්වේ 36 (1).

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා දැන්නේ කියන්නේ? හැමදාම 36 (1) කියලා ප්‍රශ්න දාලා -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මෙතුමා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට සිද්ධ වෙනවා ඉස්සරහාට ඔබතුමාව නම් කරන්න. මෙහෙම සභාව යන්න බැහැ. අනෙක් මන්ත්‍රීවරුන්ගේ කාලය පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ගරු සභාපතිතුමනි, මම 36 (1) යටතේ ඔබතුමාට වරප්‍රසාද ප්‍රශ්නයක් යොමු කරනවා. පසුගිය පළාත් සභා රැස්වීමේදී හැන්සාඩ් වාර්තාව අපට ලැබිලා තිබෙනවා. ඒකේ 23 වැනි පිටුවේ උදය ගම්මන්පිල ගරු ඇමැතිතුමා බොහොම පැහැදිලිව යම් ප්‍රකාශයක් කරලා තිබෙනවා. ඔබතුමාගේ අවධානය ඒ සඳහා යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හැබැයි එදා රැස්වීමට එතුමා ආවේ නැහැ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

එතකොට තේරෙයි මොකක්ද මේ කියන්නේ කියලා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, -

**ගරු යූ. ජෝර් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

එතුමාම කියපුවා තමයි මේ අනෙක් පැත්ත හරවලා කියන්නේ.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

වෙන කවුරුත් නොවෙයි. මෙතුමාම කියපුවා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, 36 (1) යටතේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා සභාව නිශ්ශබ්ද වෙන්න.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, මේ මන්ත්‍රීවරුන්ට මෙහෙම රණ්ඩු වෙන්න දෙයක් නැහැ. අපි මතු කරලා තිබෙන්නේ, පසුගිය හැන්සාඩ් වාර්තාවේ 23 වැනි පිටුවේ උදය ගම්මන්පිල ගරු ඇමැතිතුමා බොහොම පැහැදිලිව කියනවා,

*"34 රීතිය. ගරු සභාපතිතුමනි, 34 යටතේ එන පෞද්ගලික පැහැදිලි කිරීම් නිශ්චිත අර්ථයෙන් ගත්තොත් තමන්ට සිදු වූ යම් සිදුවීමක් ගැන සභාවට පැහැදිලි කිරීමක්, විස්තරාත්මක කරුණු දැක්වීමක් තමයි බලාපොරොත්තු වෙන්නේ. එහිදී සභාපතිතුමාගේ අනුමැතිය තිබිලා, සභාපතිතුමාගේ අභිමතය යටතේ කරන්නේ. එහිදී වෙනත් පුද්ගලයන් සම්බන්ධයෙන් තමන්ට බලපාපු නැති අය ගැන කථා කරන්න බැහැ. ආරක්ෂක ලේකම්තුමා ගැන කථා කරන්න කිසි බාධාවක් නැහැ. කථා කරන තැන. පෞද්ගලික පැහැදිලි කිරීම් නොවෙයි."*

උදය ගම්මන්පිල ගරු ඇමැතිතුමා මේක බොහොම පැහැදිලිව කියනවා.

**ගරු සිරිකමල් ෆිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

කුමන්ත්‍රණයක් නැහැ. ඕනෑ නම් මොකක්ද වුණේ කියලා කුමන්ත්‍රණය කියන්නම්.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

දැන් එතුමාට අමතක වෙලා.

[සභාවේ ඝෝෂා]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එතුමා කථා කරද්දී වෙන නීතියක්. ඒකයි අපි කියන්නේ. මේක අර රාජපක්ෂ ආණ්ඩුව වගේ නොවෙයි.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, අපි විරුද්ධ නැහැ. උදය ගම්මන්පිල ගරු ඇමැතිතුමාගේ ප්‍රකාශයට අපි විරුද්ධ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර නිශ්ශබ්ද වෙන්න.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගම්මන්පිලලා, විමල් වීරවංශලා තියාගෙන ඉන්න එක ගැන තමයි එදා කථා කළේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා ඔබතුමන්ලා වාඩි වෙන්න.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

එතුමාගේ කථාවට අපේ විරෝධයක් නැහැ. ගරු සභාපතිතුමනි, අපි එතුමාගේ කථාවට විරෝධයක් නැහැ. ඔබතුමා සභාපතිවරයා විධියට අපි ඔබතුමාගෙන් පැහැදිලි කිරීමක් අහන්නේ. අපි කාගෙන්වත් අහන්නේ නැහැ. ඔබතුමාගෙන් අහන්නේ. ඔබතුමාට හිතෙනවා නම් උදය ගම්මන්පිල ගරු ඇමැතිතුමාට එතුමාගේ කථාව පවත්වන්න ඉඩ දෙන්න. ඒ පිළිබඳව ගැටළුවක් නැහැ. අපි ඔබතුමාගෙන් අහන්නේ එතකොට උදය ගම්මන්පිල ගරු ඇමැතිතුමා -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අපි කථා කරද්දී එතුමා විග්‍රහ කරන්නේ වෙන විධියකින්.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ඔබතුමාගේ මතය අපට කියන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මගේ මතය කියන්න ඔබතුමා වාඩි වෙන්න.

[සභාවේ ඝෝෂා]

කරුණාකර සභාව නිශ්ශබ්ද වෙන්න. 34 (1) රීතිය යටතේ පෞද්ගලික පැහැදිලි කිරීම් කිරීමට ඕනෑම මන්ත්‍රීවරයෙකුට අවස්ථාව ලබා දීලා තිබෙනවා. එතැනදී කිසිම ගැටළුවක් නැහැ. එතුමන්ලා කථා කරන ඒවා මට නවත්වන්න බැහැ. අදහස් ප්‍රකාශ කිරීම විනාඩි 03 හරි විනාඩි 05 හරි ඇතුළත එතුමාගේ මතය ඉදිරිපත් කරනවා. ඒක මට වෙනස් කරන්න බැහැ. ඒ නිසා එතුමාට අවස්ථාව ලබා දීලා තිබෙනවා. ඔබතුමා කථා කරන්න ගරු ඇමැතිතුමා. තව විනාඩි 02 ක කාලයක් තිබෙනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අපටත් කථා කරන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමා නිශ්ශබ්ද වෙන්න. ඔබතුමා වරින් වර බාධා කිරීම් කරන්න එපා.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** - අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු සභාපතිතුමනි, මගේ ප්‍රකාශය -

[සභාවේ ඝෝෂා]

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[Expunged on the order of the chair]*

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අට පාස් නැති, O/L පාස් නැති එක්කෙනා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, මෝඩයා කිව්වා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා වාඩි වෙන්න. මම ඒ මෝඩයා කියන වචනය ඉවත් කරනවා.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ඇමැතිතුමා නැගිට්ටා විතරයි මෝඩයා කිව්වා. ඒක හරි නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා සභාව නිශ්ශබ්ද වෙන්න.

**ගරු සුනිල් ජයමිණි** - සභානායකතුමා
Hon. Hon. Sunil Jayamini - Leader of the House

විපක්ෂ නායකතුමා දැන ගන්න ඕනෑ කට්ටිය පාලනය කර ගන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු සභානායකතුමා ඔබතුමාත් නිශ්ශබ්ද වෙන්න. හැම කෙනෙක්ම නිශ්ශබ්ද වෙන්න. මේ සභාව මේ විධියට යන්න බැහැ. ඔබතුමා සභානායකතුමා. මේ සභාව කරගෙන යන්න උදව් කරන්න. ගරු ඇමැතිතුමා, ඔබතුමාට විනාඩි 02 ක කාලයක් තිබෙනවා.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** - අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු සභාපතිතුමනි, -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මෝඩයා කියපු එක ඉල්ලා අස්කර ගන්න කියන්න.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** - අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු සභාපතිතුමනි, අධිකරණ සේවා කොමිසමේ ලේකම් මංජු තිලකරත්න මහත්මයා අධිකරණයට බලපෑම් තිබෙන බවට ප්‍රසිද්ධ ප්‍රකාශයක් කරනවා. ඒ වාගේම ඊට සමගාමීව එතුමාට එරෙහිව විනය චෝදනාවන් මතු වෙනවා. ඒ වාගේම ඊට පසුව විධායකය සහ අධිකරණය අතර පැවැත්වීමට නියමිත වුණු සාකච්ඡාවකට සහභාගී වීම - මීට කලින් එහෙම පූර්වාදර්ශයන් තිබෙනවා. නමුත් අධිකරණයේ ස්වාධීනත්වය පිළිබඳව මහජන විශ්වාසය බිඳ වැටීමක් සිදු වේය යන පදනමින් ඒ රැස්වීමට සහභාගී වීම ප්‍රතික්ෂේප කරනවා. මෙන්න මේ සිදුවීම් දාමය මැද තමයි, මේ සිදුවීම් දාමයේ මධ්‍ය ලක්ෂය වන අධිකරණ සේවා කොමිසමේ ලේකම්වරයාට පහර දීම සිදු වන්නේ. පහර දුන්නේ කවුදැයි මා දන්නේ නැහැ. කවුරු පහර දුන්නත් - කවුරු හරි දන්නවා නම්, මම ඉල්ලා සිටින එකම දේ අනේ දැම්මම නම කියන්න. අපි ලැහැස්තියි ඔහුට දඬුවම් කරන්න.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

රාජපක්ෂ බලවේගය.

**ගරු සුනිල් ජයමිණි** - සභානායකතුමා
Hon. Hon. Sunil Jayamini - Leader of the House

මෙතුමා කියනවා රාජපක්ෂ පහර දුන්නා කියලා.

[සභාවේ ඝෝෂා]

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** - අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු සභාපතිතුමනි, මෙම ප්‍රහාරය අපි ඉතාමත් පිළිකුලෙන් හෙලා දකිනවා. ඒ වාගේම මේ වැරැදිකරුවන් සෙවීමට, ඔවුන්ට නිසි දඬුවම් ලබා දීමට ප්‍රමුඛතාවයෙන් කටයුතු කිරීමේ වගකීම තිබෙන්නේ විපක්ෂයට නොවෙයි. ආණ්ඩුවට. රජයට. ඒ නිසා ඒ වගකීම (බාධා කිරීමක්) -

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

අර භාරත ලක්ෂ්මන්ගේ ඝාතකයන් හොයනවා වාගේ.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** - අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ක්ෂණිකව ඉටු කිරීමට අපි බැඳිලා ඉන්නවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා අවසන් කරන්න.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** - අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

අවසන් කරන්න යන්නේ. ගරු සභාපතිතුමනි, මේ සභාවේ ප්‍රශ්නයක් මතු වුණා උදය ගම්මන්පිල විසින් මීට සති දෙකකට කලින් කරපු ප්‍රකාශයක් සහ අද කරන පෞද්ගලික පැහැදිලි කිරීමක් කියන දෙක අතර -

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

එහෙම ප්‍රකාශ කරන්න දෙන්න බැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාට කාලය තියෙනවා. පොඩ්ඩක් ඉන්න කෝ?

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

ඔබතුමා උත්තරය ඉල්ලුවා නේ?

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

එහෙම කථාවක් කරන්න පුළුවන්ද? එහෙම නම් වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කරන්න.

**ගරු සභාපතිතුමා**

Mr. Chairman

එතුමා පැහැදිලි කිරීමක් කරන්නේ.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

නැහැ, නැහැ. මේකේ නීතියක් තිබෙනවා. මේකේ නීතියක් තියෙන්න ඕනෑ. එහෙම බැහැ. තමුන්නාන්සේ කොහොමද -

[සභාවේ ඝෝෂා]

**ගරු නිමල් ලාන්සා - අමාත්‍යතුමා**
Hon. Nimal Lansa - Minister

අහගෙන ඉන්න බැහැ. දැන් අමාරුයි. අහගෙන ඉන්න බැහැ.

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

ඒක වැරැදියි.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල - අමාත්‍යතුමා**
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු සභාපතිතුමනි, මාතෘකාවෙන් පිට මම එක වචනයක් කථා කළොත් ඔබතුමා මාව වාඩි කරවන්න. මම මාතෘකාවෙන් පිට කථා කරන්නේ නැහැ. කථාව අවසන් කරන්න මගේ කාලය මට දෙන්න.

[සභාවේ ඝෝෂා]

ඒක එතුමා තීරණය කරයි. තමුන්නාන්සේලා තීරණය කරන්න එපා. ගරු සභාපතිතුමනි, එතුමන්ලා ප්‍රශ්නයක් මතු කරලා උත්තර දෙද්දී කෑගහනවා. මොකක්ද මේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා, පොඩ්ඩක් නිශ්ශබ්ද වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මොන වරප්‍රසාද යටතේද කථා කරන්නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා පොඩ්ඩක් ඉන්න. පෞද්ගලික පැහැදිලි කිරීම්වලට විනාඩි 30 ක කාලයක් තිබෙනවා. ආණ්ඩු පක්ෂයට විනාඩි 20 යි. විපක්ෂයට විනාඩි 10 යි. ඒ නිසා ඒ පිළිබඳ තීරණ ගන්නේ සභාපතිවරයා වශයෙන් මම. කාලය කොපමණද කියන එක. ඒ නිසා එතුමාට විනාඩි 05 ද 10 ද දෙන්නේ කියන එක මමයි තීරණය කරන්නේ. ඒක කාටවත් තීරණය කරන්න බැහැ. එතුමාට අපි විනාඩි 05 යි දීලා තිබෙන්නේ. නමුත් අද ආණ්ඩු පක්ෂයට පැහැදිලි කිරීම් දෙකයි තිබෙන්නේ. විනාඩි 10 යි යන්නේ. තවත් විනාඩි 10 ක් ඉතුරු වෙලා තියෙනවා. මට ඒ විනාඩි 10 න් එතුමාට කාලය ලබා දෙන්න පුළුවන්. ගරු ඇමැතිතුමාට විනාඩි 05 ක කාලයක් තිබෙනවා. කථා කරන්න.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල - අමාත්‍යතුමා**
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු සභාපතිතුමනි, මම මේ ආණ්ඩුවේ පළාත් අමාත්‍යවරයෙක්. මම විධායකයේ කොටසක්. මම මේ බස්නාහිර පළාත් සභාවේ මන්ත්‍රීවරයෙක්. මම ව්‍යවස්ථාදායකයේ කොටසක්. මම මේ අධිකරණයේ වෘත්තීය නීතිඥයෙක්. මම අධිකරණයේ කොටසක්. ව්‍යවස්ථාදායකයටත්, අධිකරණයටත්, විධායකයටත් කියන තුනටම අයත් වන මේ පළාත් සභාවේ ඉන්න මන්ත්‍රීවරුන් 104 දෙනාගෙන් එකම පුද්ගලයා මම පමණක්ය කියන එක මේ සභාවට මතක් කරන්න කැමැතියි. මේක මගේ පෞද්ගලික පැහැදිලි කිරීමක් නොවෙයි නම්, කාගේ පෞද්ගලික පැහැදිලි කිරීමක්ද ගරු සභාපතිතුමනි?

[සභාවේ ඝෝෂා]

**ගරු සිරිකමල් පිලීෂියන් ද සිල්වා**
Hon. Sirikamal Felician De Silva

කීර්ති උඩවත්ත කඩේ යන්නේ නැහැ.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල - අමාත්‍යතුමා**
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු සභාපතිතුමනි, අධිකරණයේ ස්වාධීනත්වය වෙනුවෙන් අපි පෙනී ඉන්නේ. අධිකරණය ගැන දන්නේ නැති, විධායකය ගැන - ගරු සභාපතිතුමනි, මම කලින් පෙන්නුවා මේ මන්ත්‍රීවරුන් 104 දෙනාගෙන් මා පමණමයි මේ ආයතන තුනටම සම්බන්ධ පුද්ගලයෙක් විධියට මේ සභාවේ ඉන්නේ. ඒ නිසා මේ සභාවේ මේ මාතෘකාව ගැන කථා කරන්න මට බැරි නම් කාටද පුළුවන් කියලා මට ප්‍රශ්න කරන්න වෙනවා.

[සභාවේ ඝෝෂා]

ගරු සභාපතිතුමනි, සමහරු ආසයි අධිකරණයේ ස්වාධීනත්වය නැති වෙනවා දකින්න. අවුල් ජාලාවක් බවට මේ රට පත් වෙනවා දකින්න. අපි අධිකරණයේ ස්වාධීනත්වය වෙනුවෙන් පෙනී සිටින්නේ, රට ස්ථාවර වෙන්න. අධිකරණයේ ස්වාධීනත්වය අවශ්‍ය නිසා. ඒ නිසා මංජුල තිලකරත්න මහතාට කරපු පහර දීම අපි පිළිකුලෙන් හෙලා දකින්නේ, මේ රට ස්ථාවරව තිබිය යුතු නිසා. එතුමාට තව ගහපුදෙන්. තව අධිකරණයේ කට්ටිය ගුටි කාපුදෙන්. අධිකරණය අවුල් ජාලාවක් වෙද්දෙන් කියලා කුරිරු සතුටක් ලබන පිරිසක් මෙතැන අද ඉන්න බව තමයි මේ කෑකොස්සන් ගැහීමෙන් පෙනෙන්නේ. ඒ නිසා අද

මේ කාට හරි සැකයක් තිබුණා නම් ඒ සැකය මෙතුමන්ලාගේ හැසිරීමෙන්ම තේරුණා. කවුද මේවා කරවන්නේ කියන එක.

[සභාවේ ඝෝෂා]

ගරු සභාපතිතුමනි, අවසාන වශයෙන් බස්නාහිර පළාත් සභාවේ ආණ්ඩු පක්ෂය වෙනුවෙන් අපි මේ පහර දීම හෙළා දැකලා නතර වෙන්නේ නැතුව වැරැදිකරුවන්ට දඬුවම් කරන්නට අපි පෙනී සිටිනවාය කියන එක සිහිපත් කරමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

ගරු සභාපතිතුමනි, මේ අවස්ථාව සලසා දීම පිළිබඳව ඔබතුමාට මුලින්ම මගේ ගෞරවය පුද කරනවා. මේ රටේ නීතිය, අධිකරණයේ ස්වාධීනත්වය සම්බන්ධයෙන් බරපතළ ගැටළුවක් අද ඇති වී තිබෙනවා. ගිය ඉරිදා පෙරවරු 8.15 ත් 8.45 ත් අතර කාලය තුළදී අධිකරණ කොමිෂන් සභාවේ ලේකම්තුමාට පහර දීමක් සිදු වුවා. එයට කලින් යම් මැර කණ්ඩායමක් මන්නාරම මහේස්ත්‍රාත් උසාවියට පහර දීමක් සිදු කළා. එම අධිකරණයේ පැවැති නඩු කටයුත්තකට අදාළව යම් බලවත් දේශපාලඥයෙකු එකී විනිශ්චයකාරවරයාව එම අධිකරණයෙන් මාරු කරවා ගැනීමට අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්ට බලපෑම් සිදු කළ බවට එකී ලේකම්වරයා විසින් දැනටමත් අභියාචනාධිකරණයට දිවුරුම් පෙත්සමක් ඉදිරිපත් කර තිබෙන බව අපි දන්නවා. අධිකරණයේ ස්වාධීනත්වයට බලපෑම් සිදු වූ බවට එතුමා ප්‍රකාශයක් ඉන් පසුව නිකුත් කළා. එකී පසුබිම තුළ තමයි අධිකරණ සේවා කොමිෂන් සභාවේ ලේකම්තුමාට ගිය ඉරිදා පහර දීම සිදු වන්නේ. එම පහර දීම සිදු වී මේ මොහොත වන විට පැය 49 ක කාලයක් ගත වී තිබෙනවා. අපි දන්න තරමට ලංකාවේ පොලීසිය අපරාධයක් සිදු වීමෙන් පැය 24 ක් ඇතුළත ඕනෑම අපරාධයක් විසඳීමේ හැකියාව තිබෙන, දක්ෂතාවය තිබෙන, නිපුණත්වය තිබෙන පොලිස් නිලධාරීන් සිටින ආයතනයක්.

එසේ වුවත් ඉතා කනගාටුවෙන් මේ සභාවට මා කියා සිටින්නේ, එම සිද්ධිය සිදු වී මේ මොහොත වනවිට පැය 49 ක් ගත වී තිබුණත් තවමත් කිසිම කෙනෙකු අත්අඩංගුවට ගෙන නොමැති බව වාර්තාගත කරන්නට සිද්ධ වෙනවා. අවසානයේදී කොහේ හරි යන කුඩුකාරයෙක් අරගෙන විත්තිකාරයා හැටියට ඉදිරිපත් කිරීමේ තත්ත්වයක් මේ නඩුවේදීත් මතු වේද යන්න පිළිබඳව ගැටළුවක් මතු වෙනවා. ගරු සභාපතිතුමනි, ගිය ඉරිදා විස්සයි විස්ස ලෝක කුසලාන අවසාන තරගය තිබුණා. එම තරගය ශ්‍රී ලංකාව ජයග්‍රහණය කළා නම් පසුදා උදේ වනවිට බොහෝ විට සියලු දෙනාගේ අවධානය යොමු වන්නේ එම ක්‍රිකට් මැච් එකට අදාළවයි. එකී තත්ත්වය ඇති වේය යන බලාපොරොත්තුවෙන් කිනම් හෝ අයෙකු මේ දිනයේ මේ පහර දීම ඉතාමත්ම සැලැස්මක් ඇතිව කර ඇති බව අප කාටවත් පැහැදිලි වෙනවා. එයට අමතරව මේ රටේ බලය ඇති අය ව්‍යවස්ථාදායකය, විධායකය, අධිකරණය යන තුනම එකට කටයුතු කළ යුතු වන බවට ප්‍රකාශ කරනවා. මගේ මිත්‍ර ගරු ඇමැතිතුමාත් ඒ ප්‍රකාශය කළා. මෙම අංශයන් තුනේ සහයෝගයෙන් කටයුතු කරනවාය යන්නෙන් අදහස් කරන්නේ, එක් ආයතනයකට අවශ්‍ය දේ ඉටු කිරීමට අනෙක් ආයතනය ඔළුව නැමීම නොවෙයි.

විශේෂයෙන් ලෝකයේ ශිෂ්ට සමාජයන් තුළ ව්‍යවස්ථාදායකය, විධායකය සහ අධිකරණය කියන කොටස් තුනට බලය බෙදලා තිබෙන්නේ එක් අංගයකින්, එක් අංශයකින් වැරැදි සහගතව ක්‍රියා කිරීමක් සිදු වුවහොත් එය අනෙක් අංගයන් මගින් පාලනය කර ගැනීමට හැකි වනු පිණිසයි. මේ අනුව ව්‍යවස්ථාදායකය, විධායකය සහ අධිකරණය සහයෝගයෙන් කටයුතු කිරීම යන තේමාව මත විධායකයට හෝ ව්‍යවස්ථාදායකයට තමන් කැමැති ආකාරයකට නීතිය කඩ කරමින්, තමන්ට උවමනා ආකාරයට නීතිය උල්ලංඝණය කරමින් කටයුතු කරන අවස්ථාවකදී අධිකරණය එයට ඔළුව නමා එය අනුමත කිරීම මෙම සහයෝගය ලබා දීමක් ලෙස අපට සැලකිය නොහැකි වෙනවා. මේ බලය බෙදා දීම මේ රටේ ඇති කරලා තිබෙන්නේ, රටක ඒකාධිපති ස්වරූපයක් ඇති වීම වැළැක්වීම සඳහායි. එක් පුද්ගලයෙකුගේ දෑත් තුළ සියලු බලයන් කේන්ද්‍රගත වීම හේතුකොටගෙන එම රටේ ඒකාධිපතිවාදයක් ඇති විය හැකි වන බවටත් ඉතිහාසයෙන් පෙන්නුම් කර තිබෙනවා. එකී තත්ත්වය යටතේ ව්‍යවස්ථාදායකය සහ විධායකය යම් හෝ වැරැදි කටයුතු කරන අවස්ථාවකදී රටේ ජනතාවගේ අයිතිවාසිකම්, සාධාරණත්වයත්, ප්‍රජාතන්ත්‍රවාදයත් ආරක්ෂා කර ගැනීම සඳහා අධිකරණයට ස්වාධීනව කටයුතු කිරීමේ අවශ්‍යතාවයක් ඇති වෙනවා. එවන් ස්වාධීනව කටයුතු කරන අවස්ථාවකදී සහ, හෝ එවන් ස්වාධීනව කටයුතු කිරීම මත යමෙකුට පහර දීමක් සිදු වෙනවා නම්, එයින් පෙන්නුම් කරන්නේ ශිෂ්ට සම්පන්න සමාජයක් ඇති කර ගැනීමට එරෙහි වූ යම් කොටසක් මේ සමාජය තුළ අදත් ක්‍රියාත්මක වන බවයි. එයට එරෙහිව අපි සියලු දෙනා වෘත්තිකයන් හෝ වේවා, දේශපාලඥයන් හෝ වේවා, ජාති භේද, ආගම් භේදවලින් තොරව එවන් ඒකාධිපති කොල්ලයක් කරා යන ක්‍රියාවලියකට එරෙහිව නැගී සිටිය යුතු වන බවයි මගේ අදහස.

ගරු සභාපතිතුමනි, මේ අනුව මම ඔබතුමාගේ අවධානයට යොමු කරන්නේ, මෙම ම්ලේච්ඡ පහර දීම, මෙය එක් පුද්ගලයෙකුට එරෙහිව කළ ක්‍රියාවක් නොවන බවටත්, එය මුළු සමාජ ක්‍රමයට එරෙහිව කරන ලද ක්‍රියාවක් වන නිසා එයට දේශපාලන හෝ ආගම්, ජාති භේද, වෘත්තිකයින් යන භේදයන්ගෙන් තොරව සියලු දෙනා ඒකරාශී වී මෙම ක්‍රියාවලියට එරෙහිව නැගී සිටිය යුතු වන බවත්, එම වැරැදි සහගත ක්‍රියාවලිය කළ යම් පුද්ගලයෙක් වේ නම් හෝ පුද්ගලයින් වේ නම් ඔවුන් කොතරම් බලවත් අය වුවත් ඔවුන් නීතියේ රැහැනට හසු කරවාගෙන ඔවුනට දඬුවම් දීමේ ප්‍රයත්නයට අප සියලු දෙනාගේම සහාය ලබා දිය යුතු වන බවටත් ඉතා ගෞරවයෙන් ප්‍රකාශ කරමින් නැවතත් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම ඉතාමත් සන්තෝෂ වෙනවා. එතුමාගේ විනාඩි 04 ක කාලය තුළ ආණ්ඩු පක්ෂයේත්, විපක්ෂයේත් ගරු මන්ත්‍රීතුමන්ලා බොහොම හොඳට සභාව තුළ හිටියා. ඉතින් මේ වාගේ ඉන්න කෝ දෙයියනේ කියලා. මේ වාගේ ඉන්න පුළුවන් නේ? ඇයි ඔබතුමන්ලා ආවේගශීලී වෙන්නේ? එතුමා කථා කරනකොට කවුරුවත් එතුමාට බාධා කළේ නැහැ. සභාවේ ඔය විධියට ඉන්න. ඇයි බැරි? අද ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා හොඳටම හොඳයි. එතුමා අද බොහොම හොඳයි. විපක්ෂයේ [ ගරු සභාපතිතුමා ]

ප්‍රධාන සංවිධායකතුමාත් ඒ වාගේම ඉන්න. ඒ වාගේම ඔබතුමන්ලාත් එහෙම ඉන්න. බාධා කිරීම් කරන්න එපා. රීති ප්‍රශ්නයි, වරප්‍රසාද ප්‍රශ්නයි කියලා සභාවේ කාලය අනවශ්‍ය විධියට ගන්න එපා. හැමදාම මේක කරන්න එපා. රීති ප්‍රශ්න, වරප්‍රසාද ප්‍රශ්න කියලා හැමදාම මයික්‍රෆෝන් On කරගෙන කෑගහනවා. මම දෙපැත්තටම කියන්නේ. එහෙම කරන්න එපා. කාලය ඕනෑ තරම් දෙන්න පුළුවන්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඇත්ත කථා කරනවා නම් අහගෙන ඉන්න පුළුවන්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඇත්ත කථා කරන්නේ. කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව. ඔබතුමාට විනාඩි 03 ක කාලයක් තිබෙනවා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු සභාපතිතුමනි, හොරණ අධ්‍යාපන කලාපයට අයත් තක්ෂිලා කණිෂ්ට විද්‍යාලයට කුළුපන කණිෂ්ට විද්‍යාලය 2005 දී ඒකාබද්ධ කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කරලා, එම ළමුන් 28 ක් ඉන්න පාසල අද වනකොට හොරණ කලාපයේ ප්‍රසිද්ධ පාසලක් බවට පත් වෙමින් ළමුන් 800 කට එහා සංඛ්‍යාවක් ඉගෙන ගන්න පාසලක් බවට පත් වෙලා තිබෙනවා. ඒ වාගේම ශිෂ්‍යත්ව විභාග ප්‍රතිඵල නිකුත් වීමේදී පසුගිය වසරට එහා වසරේදී ලංකාවෙන්ම දෙවැනි ස්ථානයත්, තුන්වැනි ස්ථානයත් ලබා ගත්තු ශිෂ්‍යයාවන් ඉන්න පාසලක් එම පාසල. එම පාසලේ විදුහල්පතිතුමන්ලා සහ උගන්වන ගුරුවරුන් ඒ ප්‍රදේශයේ ජනතාවගේ දරුවන්ව ඉතාමත් ශක්තිමත් කරවමින් මේ පාසල ක්‍රියාත්මක කරගෙන ගියා. නමුත් අද වනකොට ඒ පාසලේ ඉගෙන ගන්න දුවලා පුතාලා සහ එම දරුවන්ගේ දෙමව්පියන් අපෙන් විශේෂ ඉල්ලීමක් කරලා තිබෙනවා. ඒකාබද්ධ කරපු පාසල අනුබද්ධ පාසලක් බවට පරිවර්තනය කරන්න යනවා කියන මතය එම පාසලේ ඉගෙන ගන්න දරුවන් සහ දෙමව්පියන් අතර ප්‍රචලිත වෙමින් විශාල රැස්වීමක් පවත්වලා අපේ යසපාල කෝරලගේ ගරු මන්ත්‍රීතුමාත් මම අපි දෙන්නාම ඒ පාසලට ගිහිල්ලා ඒ ඇති වෙලා තිබුණු කළබලකාරී තත්ත්වයත්, ඒ වැරැදි හැඟීම ක්‍රියාත්මක වන ආකාරය පිළිබඳවත් විමසා බලමින් ප්‍රධාන වේදිකාවේ ඉඳගෙන සිටි අපි දෙන්නාම ප්‍රකාශයක් නිකුත් කළා. ඒ වාගේම ඒකාබද්ධ කරපු පාසල අනුබද්ධ කරන්න ඉඩ දෙන්න එපා කියන ඉල්ලීම දෙමව්පියන් විසින් අප වෙත ඉදිරිපත් කළා.

එහෙම නම් ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ මාර්ගයෙන් මම ගරු ප්‍රධාන ඇමැතිතුමාට යොමු කරන්න කැමැතියි. අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්තුමාටත්, හොරණ කලාපයේ කලාප අධ්‍යක්ෂතුමාටත් මේ වාගේ විශිෂ්ට පාසලක් බවට පරිවර්තනය වුණු ළමයින් 28 ඉඳලා අද 800 කට වැඩි ප්‍රමාණයක් අවුරුදු 07 ක් ඇතුළත සංවර්ධනය වුණු දියුණු පාසල ඒකාබද්ධ පාසලක් හැටියට දැනට පවත්වාගෙන යනු ලබන බව කියන ඉල්ලීමට දෙමව්පියෝ සියලු දෙනාම අත්සන් කරලා ලේඛනයක් හදලා ලිපියක් හැටියට සභාගත කරලා ඉදිරිපත් කළා, මේක ගරු ප්‍රධාන ඇමැතිතුමාගේ අවධානයට යොමු කරන්නය කියලා. එහෙම නම් සභාවෙනුත්, ඒ වාගේම ඔබතුමාගෙනුත් මම ඉල්ලීමක් කරන්න කැමැතියි. මේ පාසලේ ඉගෙනුම ලබන ළමයින් වෙනුවෙනුත් ඒ ප්‍රදේශයේ දෙමව්පියන් වෙනුවෙනුත් මේක මම සභාගත කරනවා. ඒ යෝජනව ඒකාබද්ධ පාසලක් හැටියට පවත්වාගෙන යන වැඩ පිළිවෙළ තව ඉදිරියටත් ක්‍රියාත්මක කරගෙන යන වැඩ පිළිවෙළක් හැටියට සඳහන් කරලා, තක්ෂිලා කණිෂ්ට විද්‍යාලයට පහේ පන්තියෙන් ඉහළ ඉගෙන ගන්න සියලුම ළමුන්ව නැවත වාරයක් ඇතුළත් කර ගැනීම සඳහා ඉඩ පසුකම් ලබා දීමටත් - එම ගොඩනැගිල්ල ආදි ශිෂ්‍යයන් විසින් සාදා දීමටත් කටයුතු කරලා තිබෙනවා. ඉතිරි මුදල් ප්‍රතිපාදනය ලබා දීලා එය ක්‍රියාත්මක කරන්නය කියන ඉල්ලීම ඔබතුමා මගින් ගරු ප්‍රධාන ඇමැතිතුමාට ඉදිරිපත් කරමින් එතුමාගේ අවධානය යොමු කිරීම සඳහා දෙමව්පියෝ ලබා දීපු ඒ ලිපි ගොනුව මම සභාගත කරනවා.[1]

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

ගරු සභාපතිතුමනි, මේ මොහොතේ රට තුළ මතුව ඇති ආන්දෝලනාත්මක සිදුවීමක් පිළිබඳව ඔබතුමාගේ සහ සභාවේ අවධානය යොමු කරන්න කැමැතියි. ඔබතුමා දන්නවා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පළමුවැනි පරිච්ඡේදයේ අංක 3 යටතේ ශ්‍රී ලංකා ජනරජයේ පරමාධිපත්‍ය ජනතාව කෙරෙහි පිහිටා ඇත්තේය කියලා බොහොම පැහැදිලිව සඳහන් කරලා තියෙන බව. ඒ වාගේම ඒ පරමාධිපත්‍ය ක්‍රියාත්මක කිරීම සඳහා අධිකරණය, ව්‍යවස්ථාදායකය හා විධායකය කියන අපි කවුරුත් හඳුන්වනවා වාගේ මුල්ගල් තුනක් පත් කරලා තිබෙනවා. ඒ වාගේම මේ සමාජය ශිෂ්ට සම්පන්නව ඉස්සරහාට යන්න නම්, මේ සමාජයේ අන්‍යෝන්‍ය සහයෝගීතාවය තහවුරු කරන්න නම්

[1] සභා ලේකම් කාර්යාලයේ තබා ඇත.

මෙන්න මේ මුල්ගල් තුන එකිනෙකට ස්වායත්වයෙන්, ස්වාධීනව වාගේම සහයෝගීතාවයෙන් වැඩ කරන්න ඕනෑ. හැබැයි, දැන් අපට මේ වන සිදුවීම්වලින් පෙනෙන්නේ ගරු සභාපතිතුමනි, මේ අධිකරණය, ව්‍යවස්ථාදායකය සහ විධායකය කියන මේ ආයතන තුනට බලවත් පාර්ශවයක් මගින් ඇගිලි ගහලා විශේෂයෙන් අධිකරණයට, අධිකරණයේ ස්වාධීනත්වය කෙළසමින් යනවා කියන එකයි. මොකද, ලෝකයේ අපි මේ ආයතන ගත්තාට පස්සේ විධායකය සහ ව්‍යවස්ථාදායකය දේශපාලනිකයි කියන එක ලෝකයේ හැමෝම දන්නවා. ඒ නිසා ලෝකයේ ඕනෑම රටක් ශිෂ්ට සම්පන්න හෝ මානව හිමිකම් රකින, ප්‍රජාතන්ත්‍රවාදය රකින රටක් කියලා පිළිගන්න නම් අධිකරණයේ ස්වාධීනත්වය ආරක්‍ෂා වෙන්න ඕනෑ. ඒ නිසා අර කිව්වා වාගේ කවුරු හරි මේ මුල්ගල් තුනෙන් මුල්ගල් දෙකක් පාවිච්චි කරලා ඒක උඩ ඇණ තියාගෙන එතැන මළපහ කරන්න යනවා නම්, පහරන්න යනවා නම් ඒකට අපි කවුරුත් ඉඩ දෙන්නේ නැහැ. ඒ නිසා අධිකරණයේ ස්වාධීනත්වය රැකීම පක්‍ෂ භේදයෙන් තොරව අපි සියලු දෙනාගේ වගකීමක්. නමුත් මේක හුදෙකලා සිදුවීමක් නොවෙයි. ඔබතුමා දන්නවා 2010 මහ මැතිවරණයෙන් පස්සේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරු 225 න් එක්කෙනෙක් ඇර අතිගරු ජනාධිපතිතුමාගේ ඉඳලා ඒ කාලේ මන්ත්‍රීවරු එකතු වෙලා සම්මත කරපු 17 වැනි ව්‍යවස්ථා සංශෝධනය අයින් කරලා, 18 වැනි සංශෝධනය ක්‍රියාත්මක කළා. එතැනින් පස්සේ ස්වාධීන කොමිෂන් සභා අහෝසි කරලා තමයි මේවාට ඇඟිලි ගහන්න පටන් ගන්නේ. මේ ඒ ක්‍රියාවලියේ ප්‍රතිඵල තමයි. මොකද, අපේ රටේ පත් වුණු හැම ආණ්ඩුවක්ම අධිකරණයට විවිධාකාරයට ඇඟිලි ගහලා තිබෙනවා. හැබැයි මේ අවුරුදු 2 1/2 තරම් ඇඟිලි ගහපු, අධිකරණයට නිර්ලජ්ජිතව අපහාස කරපු ආණ්ඩුවක් තවත් නැහැ. ඒ නිසා තමයි 18 වැනි සංශෝධනය ක්‍රියාත්මක කරගෙන අධිකරණයේ ස්වාධීනත්වයට ඇඟිලි ගහන්න පටන් ගත්තේ. එතැනින් පස්සේ අර මීට ඉස්සෙල්ලා කථාවලදී කිව්වා වාගේම මන්නාරමේ අධිකරණයට, අධිකරණ තීන්දුවක් වෙනස් කරන්න කියලා ඒ විනිශ්චයකාරතුමාට බලපෑම් කරලා, දුරකථන ඇමතුම් දීලා, ඒක අසාර්ථක වුණු තැන ජනතාව කුලප්පු කරලා, උසිගන්වලා, ගල් ගහන තැනට පත් වුණා. අපි අහනවා. ආණ්ඩු පක්‍ෂයේ ඇමැතිවරයෙක්. ඒ ආණ්ඩු පක්‍ෂයේ ඇමැතිවරයා වෙනුවෙන් ආණ්ඩුව ගත්තු ක්‍රියා මාර්ගය මොකක්ද? අඩු තරමේ ඔහුව ඒ ඇමැති ධුරයෙන් අයින් කළාද? ඔහුගේ සාමාජිකත්වය අහෝසි කළාද? නැහැ. කිසිදු ක්‍රියා මාර්ගයක් ගත්තේ නැහැ. ඒ විතරක් නොවෙයි. ඔබතුමා දන්නවා. මේ අධිකරණ සේවා කොමිෂන් සභාව හැදෙන්නේ අග්‍රවිනිශ්චයකාරතුමියගෙන් සහ තවත් ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරවරු දෙදෙනෙක්ගෙන්. ඒ විනිශ්චයකාරවරුන්ව සාකච්ඡාවක් සඳහා කැඳවන්න, මේ රටේ සාමාන්‍ය පුරවැසියෙකුට පුළුවන්ද? අඩු තරමින් තමුන්නාන්සේටවත් බැහැ. මේ රටේ ඉහළම තැනට විතරයි ඒ සඳහා කැඳවන්න පුළුවන්. අධිකරණයට බලපෑම් කරන නිසා තමයි -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ කාලය අවසන් ගරු මන්ත්‍රීතුමා

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

ගරු සභාපතිතුමනි, අධිකරණයට බලපෑම් කරන නිසා තමයි ඒ අය ඒකට යන්න බැහැයි කියලා කිව්වේ. හැබැයි, එතැනින් පස්සේ මොකද වුණේ? තමන්ගේ ජීවිතයට, අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ ජීවිතයට තර්ජන එල්ල වෙලා තියෙද්දී ඒක නොතකා ආණ්ඩුව කටයුතු කළා. ඒ නිසා මේ සිදුවීම ගත්තොත් මංජුල තිලකරත්න ලේකම්වරයාට පහර දීම විතරක් නොවෙයි. සම්පූර්ණයෙන් පසුගිය කාලයේ මේ රටේ වෘත්තිකයන්ට, අධිකරණයට ප්‍රහාර එල්ල වන ක්‍රියාදාමයක් දියත් වුණා. ශ්‍රී ලංකා වෛද්‍ය සභාවේ වෛද්‍යවරු විරුද්ධ වෙද්දී -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සමාවෙන්න ගරු මන්ත්‍රීතුමා. කාලය අවසන්.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

පෞද්ගලික විශ්ව විද්‍යාල හදන්න ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විරුද්ධ වෙද්දී එහි ලේඛකාධිකාරීවරයාට (බාධා කිරීමක්)

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

කාලය අවසන්.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

පහර දුන්නා. ඒ විතරක් නොවෙයි. ඔබතුමා දන්නවා, විශ්ව විද්‍යාල ආචාර්ය සමිති සම්මේලනයේ සභාපතිවරයාට නිර්නාමික දුරකථන ඇමතුම් දෙනවා. මේ වාගේ මේ රටේ වෘත්තිකයන් පහත් කරන, නිග්‍රහ කරන තැනකට ගිහිල්ලා ආණ්ඩුව මොකක්ද කරන්නේ? ඒවාට හදනවා බටහිර බලවේග -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා කථාව අවසන් කරන්න.

**ගරු නිමල් ලාන්සා** - අමාත්‍යතුමා
Hon. Nimal Lansa - Minister

කාලය අවසන්. කාලය අවසන්.

[සභාවේ ඝෝෂා]

කාලය අවසන්. කාලය අවසන්.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

කුමන්ත්‍රණවලට, ඒ නිසා -

**ගරු නිමල් ලාන්සා - අමාත්‍යතුමා**
Hon. Nimal Lansa - Minister

කාලය අවසන්.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

අධිකරණයේ ස්වාධීනත්වයට ඇහිලි ගැසීමට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අවසන් කරන්න.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

විරෝධතාවය ප්‍රකාශ කරලා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

සම්පූර්ණ විරෝධතාවය ප්‍රකාශ කරලා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා ඔබතුමා වාඩි වෙන්න.

**ගරු නලින්ද ජයතිස්ස**
Hon. Nalinda Jayathissa

මේ සභාවෙන් අපි මේ විරෝධතාවය ප්‍රකාශ කරමින් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා නැවත මේ සභාව අවුල් කළා. හොඳට සභාව ගියා. ඔබතුමා නැවතත් අනවශ්‍ය ප්‍රශ්නයකට ගියා. කාලය අවසන් වුණාම කථාව අවසන් කරන්න.

මීළඟට කීර්ති උඩවත්ත ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව. ඔබතුමාට විනාඩි 05 ක කාලයක් තිබෙනවා.

**ගරු කීර්ති උඩවත්ත**
Hon. Keerthi Udawatte

ගරු සභාපතිතුමනි, වෘත්තියෙන් නීතිඥයෙක් හැටියට අවුරුදු 18 ක් සේවය කරපු කෙනෙක් විධියට -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක**
Hon. U. George Perera - Chief Opposition Whip

හරි දුකයි.

**ගරු නිමල් ලාන්සා - අමාත්‍යතුමා**
Hon. Nimal Lansa - Minister

අහගෙන ඉන්න කෝ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විපක්ෂයේ සංවිධායකතුමා ඔබතුමා පොඩ්ඩක් මේ සභාව තුළ හොඳට හැසිරෙන්න කෝ?

**ගරු කීර්ති උඩවත්ත**
Hon. Keerthi Udawatte

මේ උද්ගත වී ඇති තත්ත්වය පිළිබඳව කරුණු පැහැදිලි කිරීමට අවස්ථාව ලබා දීම ගැන මා පළමුවෙන්ම ඔබතුමාට ස්තුතිවන්ත වන්න කැමැතියි. පළමුවෙන්ම මෙම පැහැදිලි කිරීම් ආරම්භ කරපු උදය ගම්මන්පිල ගරු අමාත්‍යතුමා කියපු විධියට ආණ්ඩු පක්ෂයේ අප සියලු දෙනාම මේ ජුගුප්සාජනක සිද්ධිය බලවත් පිළිකුලෙන් යුතුව ප්‍රතික්ෂේප කරනවා. ඊට විරෝධය දක්වනවා කියන එක පළමුවෙන්ම සඳහන් කරන්න කැමැතියි. ප්‍රශ්නය වී තිබෙන්නේ, මේ සිද්ධියේ වගකීම ආණ්ඩු පක්ෂයට හෝ විපක්ෂයට හෝ එහෙම නැත්නම් අධිරාජ්‍යවාදී කුමන්ත්‍රණයට හෝ පටවා නිහඬ වීම නොවෙයි. මෙහි වගකීම විය යුත්තේ, වරදකරුවන් ඉතා ඉක්මණින් අත්අඩංගුවට ගෙන ඔවුන්ට සුදුසු දඬුවම් පැමිණ වීම කියන එකයි මා විශ්වාස කරන්නේ. ඒ නිසා අපි බුද්ධිමත් මහජන නියෝජිතයන් විධියට මේ කාරණාවේදී වඩාත් සංවරශීලීව සහ විනය ගරුකව හැසිරිය යුතුයි කියන එකයි මා මේ සභාවට කියන්නේ. විශේෂයෙන්ම තුන්වැනි ලෝකයේ රටක් විධියට අපේ රටේ මේ අධිකරණ ක්ෂේත්‍රය තුළ උද්ගත වී තිබෙන ප්‍රශ්නය ජාත්‍යන්තර තලය සමග සංසන්දනය කරන්න පුළුවන් කාරණාවක්.

ගරු සභාපතිතුමනි, මෑතක් වනතුරුම පකිස්ථානය තුළ පැවතුණේ යුධ ආණ්ඩු. පකිස්ථානය තුළ ප්‍රජාතන්ත්‍රවාදය හිස ඔසවන හැම අවස්ථාවකම යුධ හමුදාව විසින් ඒ ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යුහය විනාශ කරලා යුධ හමුදා පාලකයන් පාලනය අතට ගත්තා. අලි බූතෝලා, බෙනාසීර් බූතෝලා විනාශ වුණේ, ඒ කුරිරු යුධ හමුදා පාලනවල බලපෑම් තුළින්. අද ප්‍රජාතන්ත්‍රවාදය පකිස්ථානය තුළ ස්ථාපිත වී තිබෙනවා. මේ ප්‍රජාතන්ත්‍රවාදී පාලනය විනාශ කිරීම සඳහා ප්‍රජාතන්ත්‍රවාදයේ ප්‍රධාන මුල්ගල් තුන වන ව්‍යවස්ථාදායකය හා විධායකය පාවිච්චි කරන්න බැරි වනකොට අධිකරණය ඒ සඳහා යොදා ගැනීමේ පූර්වාදර්ශය අපි පකිස්ථානය තුළ දකිනවා. මා මේ කාරණාව එවැනි ජාත්‍යන්තර කරුණකට ලඝු කරන්න සූදානම් වන්නේ නැහැ. මෙය ආණ්ඩුවේ වඳුරු මිතුරන් කළාද, එසේ නැතහොත් විපක්ෂය විසින් පටු දේශපාලන වාසියක් ලබා

ගැනීමට කුමන්ත්‍රණකාරීව කළාද කියන කාරණය අධිකරණය විසින් විනිශ්චය කළ යුතු කාරණාවක්. එහිදී වරදකරුවන් වන්නේ කවුද? ඒ සියලු දෙනාට තරාතිරම නොබලා දඬුවම් කිරීම ආණ්ඩුවේ වගකීමක් කියන එකයි අපි විශ්වාස කරන්නේ. ඒ වාගේම ඉතිහාසයට -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ඉතින් කරන්න කෝ?

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා** - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ඉන්න කෝ කෑගහන්නේ නැතුව.

**ගරු කීර්ති උඩවත්ත**
Hon. Keerthi Udawatte

ගරු සභාපතිතුමනි, අපේ -

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ඇයි රිදෙන්නේ? ඒ වචනයට ඇයි රිදෙන්නේ? ඇත්ත තිත්තයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා, ඔබතුමා කරුණාකරලා නිශ්ශබ්ද වෙන්න. ඔබතුමාගේ නිලයේ ගරුත්වය රැක ගන්න. ඔබතුමා විපක්ෂයේ ප්‍රධාන සංවිධායක.

**ගරු කීර්ති උඩවත්ත**
Hon. Keerthi Udawatte

ගරු සභාපතිතුමනි, විපක්ෂයේ සංවිධායකතුමාට අපි බොහොම ගරු කරනවා. මොකද, එතුමා අද වනකොට මෙතෙක් නිදාගෙන හිටපු විපක්ෂය ශක්තිමත්ව යම් විරෝධයක් සඳහා යොමු කරගෙන තිබීම ගැන මම නම් පෞද්ගලිකව සතුටු වෙනවා. හේතුව, මේ රටේ ප්‍රජාතන්ත්‍රයට වැදුණු ලොකුම පහර තමයි නිවට, නියාලු, විපක්ෂයක් මේ රට තුළ අවුරුදු ගණනාවක් පැවතීම. ඒ නිසා ඒ විපක්ෂය තුළ ශක්තිමත් දේශපාලන බලවේගයක් ගොඩ නැගෙනවා නම් ඒ සඳහා ප්‍රජාතන්ත්‍රවාදයට ආදරය කරන පුද්ගලයෙක් හැටියට වඩාත්ම අපි සතුටු වෙනවා කියන එක මේ වෙලාවේ කියන්න ඕනෑ. ආණ්ඩු පක්ෂයට වාගේම විපක්ෂයටත් මේ ප්‍රශ්නයට මැදිහත් වීමේ වගකීම තිබෙනවා. ඒ වගකීම කෝළහල කරලා, රණ්ඩු කරලා, උද්ඝෝෂණ කරලා කරන එකක් නොවෙයි. මේ සැකකරුවන් අත්අඩංගුවට ගැනීම සඳහා යම්කිසි තොරතුරක්, හෝඩුවාවක් තිබෙනවා නම් ඒක ලබා ගැනීමට රජයට උදව් කිරීම තමයි විරුද්ධ පක්ෂයේ වගකීම වෙන්නට ඕනෑ. එහෙම නැතුව මේක ආණ්ඩු පක්ෂයට, එහෙම නැත්නම් තවත් කෙනෙකුට ඇඟිල්ල දික් කරලා මේ ප්‍රශ්නයෙන් ගැලවී යන්න වගකිව යුතු විපක්ෂයකට පුළුවන්කමක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු කීර්ති උඩවත්ත**
Hon. Keerthi Udawatte

මගේ කථාව අවසන් කරන්න මම මේ ප්‍රකාශය කරන්න බලාපොරොත්තු වෙනවා. මොකද, අද මේ රටේ දැඩි සාමකාමී ස්ථාවරයක් තිබෙනවා. ඒ වාගේම දිගුකාලීන යම් ආර්ථික වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක වෙමින් පවතිනවා. පසුගිය කාලයේ මේ රටේ අධ්‍යාපන ක්ෂේත්‍රය තුළ විශාල ගැටළුවක් මතු වුණා. අපි ඒක බොහොම ස්වයං විවේචනාත්මකව පිළිගන්නවා. අද බැසිල් රාජපක්ෂ මැතිතුමාගේ නායකත්වයෙන් ඒ වැඩ පිළිවෙළට පැහැදිලි විසඳුමක් මේ සතිය තුළ ලැබෙනකොට යළිත් එවැනි අර්බුදකාරී තත්ත්වයක් නිර්මාණය වෙන්නේ කොහොමද කියන කාරණාව පිළිබඳව අපි සියලු දෙනාටම සැකයක් තිබෙනවා ගරු සභාපතිතුමනි. ඒ නිසා අධිකරණයේ තීන්දුවලට ගරු කරපු ආණ්ඩුවක් හැටියට, අධිකරණයේ තීන්දුවලට හිස නමන ආණ්ඩුවක් විදියට අපි මේ ක්‍රියාව මීට වඩා ගැඹුරින් විමර්ශනය කළ යුතුයි. මේ රට තුළ අධිකරණය සහ විධායකය ගැටුණු පළමු අවස්ථාව මෙය නොවෙයි. ඉතිහාසයේ පළමුවරට නියමිත පටිපාටියෙන් තොරව අග්‍රවිනිශ්චයකාරවරයෙකු පත් කරනු ලැබුවේ, ජේ.ආර්. ජයවර්ධන ආණ්ඩුවෙන්. එසේ පත් කරපු නෙවිල් සමරකෝන් කියන අග්‍රවිනිශ්චයකාරතුමා සමග පළමුවැනි ගැටීම හදා ගත්තේ ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගේ පාලන සමයේ. ඊට පසුව සරත් එන්. සිල්වා මහත්තයාව ඒ තනතුරට පත් කළේ චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය. එතුමිය පත් කරපු සරත් එන්. සිල්වා සමග ගැටුම්වලට මුහුණ දෙන්න එතුමියට සිද්ධ වුණා. ඒ නිසා ඉතිහාසයේ පළමුවැනි වරට සිද්ධ වුණු දෙයක් නොවෙයි මේක. අපි ප්‍රාර්ථනා කරනවා, මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදයට ගරු කරන, ප්‍රජාතන්ත්‍රවාදයට ආදරය කරන අය හැටියට මේ ආයතන අතර යම් ගැටළුවක් ඇති වී තිබෙනවා නම්, එය සමතයකට පත් වෙලා මේ රට තුළ නැවත ප්‍රජාතන්ත්‍රවාදය ඉස්මතු වෙලා විරුද්ධ පක්ෂයටත්, ආණ්ඩු පක්ෂයටත් ක්‍රියා කරන්න පුළුවන් යුගයක් උදා වේවා කියා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේදී ගරු ප්‍රධාන ඇමැතිතුමාට අවස්ථාව ලබා දෙනවා කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා කළ ප්‍රකාශය සම්බන්ධව අදහස් ඉදිරිපත් කිරීමට.

**ගරු ප්‍රසන්න රණතුංග** (ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ විෂයය භාර අමාත්‍යතුමා)
Hon. Prasanna Ranathunga (Chief Minister and the Minister of Finance and Planning, Law and Order, Land, Education, Local Government, Provincial Administration, Manpower and

Employment, Economic Promotion, Power and Energy and Trade Affairs)

ගරු සභාපතිතුමනි, කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු කාරණාව පිළිබඳව අද විශාල ගැටළුවක් බවට පත් වෙලා තිබෙනවා. සමහර නොහඳුනා ගත් කණ්ඩායම් පාසල් තුළට ගිහිල්ලා පාසල් තුළ අර්බුදකාරී තත්ත්වයක් නිර්මාණය කිරීමේ වෑයමක් තිබෙනවා. මේකත් ඒ හා සමාන කාරණාවක්. මේ සම්බන්ධව කිසිම තීන්දුවක් පළාත් සභාවක් හැටියට අපි අරගෙන නැහැ. ඒ වාගේම ප්‍රදේශයේ පාසලක් සම්බන්ධව යම් තීන්දුවක් ගන්නවා නම්, ඒක ඒ අධ්‍යාපන ව්‍යූහ කමිටුව හරහා තීන්දුවක් අරගෙන උපදේශක කාරක සභාවට ඇවිල්ලා ගත යුතු තීන්දුවක් බවට පත් වෙනවා. ඒ නිසා මේක ඒ පාසලේ විතරක් නොවෙයි. දැන් මේ වනකොට අපට පාසල් කිහිපයකින්ම තොරතුරු ලැබිලා තිබෙනවා. මේ තත්ත්වය ඇති වුණා. ගාල්ලේ පාසලේ විදුහල්පති පත් කරද්දිත් යම්කිසි පිරිසක් මේ පිටුපස

[ ගරු ප්‍රසන්න රණතුංග - අමාත්‍යතුමා ]

ඉඳගෙන ඒක අවුලකට පත් කරන්න කටයුතු කළා. මේ රටේ සාමය ඇති වෙලා තිබෙන මේ අවස්ථාවේ මේ සාමය නැති කරලා රටේ අර්බුදකාරී තත්ත්වයක් නිර්මාණය කරලා මේ හරහා දේශපාලන වාසියක් ගන්න යම්කිසි පිරිසකගේ අවශ්‍යතාවයක් තිබෙනවා. ඒ නිසා මම ගරු සභාපතිතුමා මාර්ගයෙන් ඉල්ලීමක් කරනවා. මේ වාගේ පාසල්වල කටයුත්තක් වෙනවා නම්, ඒ ප්‍රදේශයේ වගකිව යුතු ව්‍යූහ කමිටු ක්‍රියාත්මක වන තැන්වලදී මේ පිළිබඳව සොයා බලා කටයුතු කරන්න පුළුවන්කම තියෙනවා. එහෙම කටයුතු කෙරෙනවා. ඒ නිසා මේ කාරණාව මෙහෙම ලිපියකින් ඉදිරිපත් කළ යුතුත් නැහැ. මොකද, එහෙම දෙයක් සිද්ධ නොවන නිසා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු සභාපතිතුමනි, මෙතුමා දැනුවත් කරන්න ඕනෑ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විවාදයකට යන්න අවස්ථාව දෙන්න බැහැ ගරු මන්ත්‍රීතුමා.

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

යසපාල කෝරළගේ ගරු මන්ත්‍රීතුමාත් මමත් ඒ අවස්ථාවට ගිහිල්ලා ඒ විනාශකාරී තත්ත්වය අපි නැති කළා.

**ගරු ප්‍රසන්න රණතුංග –** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, කිත්සිරි කහටපිටිය ගරු මන්ත්‍රීතුමාත්, යසපාල කෝරලගේ ගරු මන්ත්‍රීතුමාත් මැදිහත් වෙලා මේ සම්බන්ධව ගත්තා වූ වැඩ පිළිවෙළට ස්තුතිවන්ත වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේදී මෙම සභාව පෙරවරු තේ විවේකය සඳහා විනාඩි 15 කට කල් තබනවා.

***ඊට අනුකූලව පළාත් සභාව තාවකාලිකව අත්සිටුවන ලදින් පූ.භා. 11.44 ට යළිත් රැස්විය.***

*Sitting, accordingly suspended until 11.44 a.m. and then resumed.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

න්‍යාය පත්‍රය අනුව ඊළඟට යෙදී තිබෙන්නේ පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු යටතේ පෞද්ගලික මන්ත්‍රී යෝජනා ඉදිරිපත් කිරීම. මංජු ශ්‍රී අරංගල ගරු විපක්ෂ නායකතුමා රීති අංක 107 යටතේ යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. එතුමාට එම යෝජනාව ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙනවා.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා –** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ගරු සභාපතිතුමනි, ඒ රීති අත්හිටුවීමේ යෝජනාව අපි වෙත භාරදීලා තියෙනවා. එහි –

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පළමුව අපි මෙතුමාට ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලබා දෙමු.

**ගරු මංජු ශ්‍රී අරංගල –** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, මේකම තමයි වැරදි සම්ප්‍රදායන් ඉදිරිපත් කිරීම. මගේ යෝජනාව ඉදිරිපත් කරන්නත් ඉස්සරවෙලා සංවිධායකවරයාට එම යෝජනාව සම්බන්ධයෙන් කථා කරන්න අයිතියක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක මම පිළිගන්නවා.

[සභාවේ ඝෝෂා]

ඔබතුමාට අවස්ථාව දෙනවා.

**ගරු මංජු ශ්‍රී අරංගල –** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

එතුමාටත් වැරදීම් වෙනවා කියලා එතුමා හිතාගන්න ඕනෑ. එතුමා හිතාගන්න ඕනෑ. එතුමා හිතාගෙන ඉන්නවා, එතුමාට වරදින්නේ නැහැයි කියලා. ඒකයි වෙලා තියෙන්නේ. ගරු සභාපතිතුමනි, මා විසින් රීති අත්හිටුවීම යටතේ යෝජනාව ඉදිරිපත් කළා. එම යෝජනාව මම

මේ වේලාවේදී සභාව හමුවේ තබනවා. රටක අධිකරණයේ ස්වාධීනත්වය,

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා මට පැහැදිලි කිරීමක් කරන්න රීති මොනවාද? එම අංක ටික මට කියනවාද?

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මම එම අංක ටික ඉදිරිපත් කරලා ඇති ඔබතුමාට

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට පොඩ්ඩක් අපැහැදිලියි. ඔබතුමා ඉදිරිපත් කරන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ස්වාධීනත්වය එරටේ සියලු ක්‍රියාදාමයන් කෙරෙහි විශේෂයෙන් බලපාන අතර,

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ ගරු විපක්ෂ නායකතුමා, ඔබතුමා රීති අත්හිටුවීමේ යෝජනාව පළමුව ඉදිරිපත් කරන්න. මෙන්න මේ යෝජනාව ඉදිරිපත් කිරීම සඳහා රීතීන් අත්හිටුවනවා කියන යෝජනාව ඒ කාරණාව ගේන්න. මොකද මට මේකේ පැහැදිලි නැහැ, මොකද මෙහි අංක වගයක් කපලා තියෙනවා.

# රීති අංක 107 යටතේ යෝජනාව
MOTION UNDER RULE NO : 107

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, “ *2012.10.09 අද දින බස්නාහිර පළාත් සභාවේ පොදු වැදගත්කමකින් යුතු හදිසි යෝජනාවක් වශයෙන් අමුණා ඇති යෝජනාව විවාදය සඳහා රීති අංක 107 යටතේ පහත රීති අත්හිටුවිය යුතු යැයි යෝජනා කරමි. රීති අංක 53(1), (2), 57(1), (2), 8(5), (6), 15(2), (4), (5), (1), (3) යෝජනා කර සිටින්නීය.*”

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඊළගට ඔබතුමාගේ යෝජනාව ඉදිරිපත් කරන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, “*රටක අධිකරණයේ ස්වාධීනත්වය එරටේ සියලු ක්‍රියාදාමයන් කෙරෙහි විශේෂයෙන් බලපාන අතර වර්තමානයේ ශ්‍රී ලංකාවේ අධිකරණයේ ස්වාධීනත්වයට බරපතළ බලපෑම් එල්ල වෙමින් පවතියි. මේ තත්ත්වය මගහැරීම සඳහා රජයේ විශේෂ අවධානය යොමු කළ යුතු යැයි මෙම ගරු සභාව රජයට යෝජනා කර සිටී.*”

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා,

**ගරු යූ. ජෝර් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

***[විසින් ස්ථිර කරන ලදී.]***
*[Seconded]*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මා වෙත ඉදිරිපත් කර ඇති රීති අතිහිටුවීමේ යෝජනාවේදි ඔබතුමා 15 (1) (2) හා (4) - (5) කියන ඒ රීති අංක දෙක කපලා තියෙනවා. මට එතන පොඩි පැහැදිලි කිරීමක් අවශ්‍යයි.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා** - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ගරු සභාපතිතුමනි,

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කථා කරන්නේ ඒ සම්බන්ධවද?

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා** - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

රීති සම්බන්ධව. මෙතුමා ඉදිරිපත් කරන රීති සම්බන්ධවයි මම කරුණු ඉදිරිපත් කරන්නේ. මෙතුමා 53 (1) අත්හිටවලා තියෙනවා. ඒ යෝජනාව ස්ථිර කළා. මම ඒක සංශෝධනයක් කර ගැනීම සඳහා තමයි නැඟී සිටියේ. ඒ සඳහා අවස්ථාවක් දුන්නේ නැහැ. ඒ නිසා 53 (1) රීතිය අත්හිටවූවාම ගරු සභාපතිතුමනි, මේ යෝජනාව ගන්න පුළුවන්කමක් නැහැ. 53 (1) කියන්නේ,

“*පොදු වැදගත්කමකින් යුත් නෑම කරුණක් විවාදයට ලක් කිරීම පිණිස යෝජනා කිරීමට කිනම් මන්ත්‍රීවරයකුට වුව ද හැකි විය යුතුය.*”

එතකොට මේ රීතිය අත්හිටෙව්වාම මේ මන්ත්‍රීවරයාට තියෙන අයිතිය තමයි එතුමා අත්හිටවා ගත්තේ. ඒ රීතිය හැර අනික් ඒවා අත්හිටුවන්න ඕනෑ. මම ඒක කියලා සංශෝධනයක් කරලා උදව්වක් කරන්න හැදුවේ. විපක්ෂ සංවිධායකතුමාගේ නොදැනුවත්කම.

[සභාවේ ඝෝෂා]

පොඩ්ඩක් මට දෙන්න. මම මෙය විවාදයට ගන්න තමයි උත්සාහ කළේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර නිශ්ශබ්ද වන්න. සභාව නිශ්ශබ්ද වන්න.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා** - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ගරු සභාපතිතුමනි, ඒකට මට අවස්ථාවක් දුන්නේ නැහැ. ඔබතුමාගෙන් මට ඒ සඳහා අවස්ථාවක් ලැබුණේ නැහැ. ඒ නිසා මේ 53 (1) යෝජනාව අත්හිටුවන්න ගෙනෙන ලද රීතිය අත්හිටුවීම තුළ, මේ යෝජනාව ගෙන ඒමට පුළුවන්කමක් නැහැ. විපක්ෂ නායකතුමා ගෙනෙන ලද යෝජනාව විපක්ෂයේ සංවිධායකතුමා ස්ථිර කළා. ඒ නිසා මේ යෝජනාව ගෙනෙන්න නොහැකි බවට මම ඔබතුමාගේ අවධානය යොමු කරනවා.

53 (1) රීති අත්හිටෙව්වාම ගරු සභාපතිතුමනි පැහැදිලිව කියනවා,

[ ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා - ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක ]

*"පොදු වැදගත්කමකින් යුත් නෑම කරුණක් විවාදයට ලක් කිරීම පිණිස යෝජනා කිරීමට කිනම් මන්ත්‍රීවරයකුට වුව ද හැකි විය යුතුය."*

ඒ අයිතිය තමයි මේ විපක්ෂ නායකතුමා - අත්දැකීම් නැති, පළපුරුදු නැති, විපක්ෂ නායකයෙක් පත් කිරීමේ ආදීනව අද මේ සභාවේදී දකින්නේ.

[සභාවේ ඝෝෂා]

**ගරු රෙහෙන්සිරි වරාගොඩ**
Hon. Rehensiri Waragoda

කිත්සිරි ඕක කියලා දෙන්න කෝ?

[සභාවේ ඝෝෂා]

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

කිත්සිරි හිටියා නම්, ඕක වෙන්නේ නැහැ.

[සභාවේ ඝෝෂා]

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, පොදු වැදගත්කමකින් යුත් ඕනෑම කරුණක් විවාදයට ලක් කිරීම පිණිස යෝජනා කිරීම කිනම් මන්ත්‍රීවරයෙකුට වුව කළ හැකිය.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හැකිවිය යුතුය.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

හැකිවිය යුතුය. ඒ අයිතිවාසිකම තමයි මේකෙන් මේ අපි ඉදිරිපත් කළේ.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා අත්හිටෙව්වේ ඒ යෝජනාව. මේකෙන් ගම්‍ය වෙන්නේ ඒකයි දැන් විපක්ෂ නායකතුමා. ඔබතුමා අත්හිටෙව්වේ 53 (1) රීතිය.

[සභාවේ ඝෝෂා]

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

ඕක කිත්සිරිගෙන් අහගන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පොඩ්ඩක් නිශ්ශබ්දවන්න ගරු මන්ත්‍රීතුමා පොඩ්ඩක් මේ ප්‍රශ්නය නිරාකරණය කරගන්න.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

36 (1) එක්කෝ රංජිත්ගෙන් අහගන්න ඕනෑ.

**ගරු නෙ ක් මල්ලව**
Hon. Neluk Mallawa

අර ප්‍රාදේශීය සභා ඡන්දෙට කරපු වැඩේ කළේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඔබතුමා ගියර් එක දානකොට රිවස් ගියර් එක දාලා තියෙන්නේ.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, මම රීතිය අත්හිටුවීම කියලා කියන්නේ, අනෙකුත් යෝජනා යටතේ. ඒ යෝජනා අත්හිටුවීමෙන් මෙම යෝජනාව ක්‍රියාත්මක කරන්නයි කියන එක ඉල්ලා සිටින්නේ

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

ඒ ඔබතුමාට තේරෙන විධිය නේ ?

**ගරු මොරිස් විෙ රත්න**
Hon.Morice Wejerathna

ඒක ඔයාට ඕනෑ විධියට බැහැ.

[සභාවේ සෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ පිළිබඳව

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

කිත්සිරිගේ ලණුව

**ගරු මංජු ශ්‍රී අරංගල** – විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

53 (3) යටතේ,

*"න්‍යාය පුස්තකයේ ඇතුළත් වී තිබෙන යෝජනාවල අනුපිළිවෙළ නොඉක්මවා ඒ ඒ සභා රැස්වීම්වල න්‍යාය පත්‍රයට සභා කටයුතු පිළිබඳ කාරක සභාවේද එකඟත්වය මත යෝජනා යම් සංඛ්‍යාවක් ඇතුළත් කළ යුතුය."*

එතකොට මේ රීතිය යටතේ පුළුවන්නේ ඉස්සරහට යන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා මට රීතිය පොඩ්ඩක් කියන්න. රීතිය මට ඇහුනේ නැහැ.

**ගරු මංජු ශ්‍රී අරංගල** – විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

53 (3) බලන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඒ සභා කටයුතු කාරක සභාව එතැන තියෙන්නේ. මහ සභාව නොවෙයි. සභා කටයුතු කාරක සභාවේ තීන්දුවක් –

**ගරු කෝකිලා හර්ෂනී ගුණවර්ධන**
Hon. Kokila Harshani Goonawardhana

පොඩ්ඩක් උදව් කරන්න අනේ පව්. ජ්‍යෙෂ්ට මන්ත්‍රීතුමාට පොඩ්ඩක් උදව් කරන්න.

**ගරු රෙහෙන්සිරි වරාගොඩ**
Hon. Rehensiri Waragoda

කිත්සිරි උදව් කරන්න කෝ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙතැන පැහැදිලිව තිබෙන්නේ ගරු මන්ත්‍රීතුමා විපක්ෂ නායකතුමා,

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා** – ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

(බාධා කිරීමක්) නාම යෝජනාත් විකුණ ගත්තු මනුස්සයා දැන් මේකත් අනාගත්තා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පොඩ්ඩක් ඇහුම්කම් දෙන්න. 53(3) රීතියට මම අවධානය යොමු කරනවා.

**ගරු රෙහෙන්සිරි වරාගොඩ**
Hon. Rehensiri Waragoda

සැබෑ විපක්ෂ නායක කොහොමද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*"න්‍යාය පුස්තකයේ ඇතුළත් වී තිබෙන යෝජනාවල අනුපිළිවෙළ නොඉක්මවා ඒ ඒ සභා රැස්වීම්වල න්‍යාය පත්‍රයට සභා කටයුතු පිළිබඳ කාරක සභාවේද එකඟත්වය ..... "* මෙතැනදී නොවෙයි.

**ගරු රෙහෙන්සිරි වරාගොඩ**
Hon. Rehensiri Waragoda

බස්නාහිර පළාත් සභාවේ අමරණීය

[සභාවේ සෝෂා]

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා** – ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ගරු සභාපතිතුමනි, මේක සභාවේ කාලය නාස්ති කිරීමක්. අපි සභාවේ න්‍යාය පත්‍රයට යමු.

**ගරු මංජු ශ්‍රී අරංගල** – විපක්ෂ නායකතුමා

Hon. Manju Sri Arangala - Leader of the Opposition

මේක දැන් මේ

[සභාවේ ඝෝෂා]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, පොඩි අතපසු වීමක් වෙලා ඇති.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විපක්ෂ නායකතුමා මේ වෙලාවේ කථා කරන්නවා නේ? ඔබතුමා නැගිට්ටේ ? බාධා කිරීම් කරන්න එපා. එතුමාට බාධා කිරීම් කරන්න එපා.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මේ කාරණාව මත මේ යෝජනාව ඔබතුමා අපිට සාකච්ඡාවට භාජනය කරන්න දෙන්නේ නැද්ද?

**ගරු යූ. ජෝර් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ඒ පිළිබඳව තීන්දු කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. ඔබතුමා වාඩි වෙන්න. මම කියන්නම්. ඔබතුමා වාඩි වෙන්න. මම කථා කරන්නම්. වාඩි වෙන්න මම කථා කරලා කියන්නම්. ගරු විපක්ෂ නායකතුමා - (බාධා කිරීම්)

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පොඩ්ඩක් මෙතුමා -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

පොඩි විනාඩියක්, ගරු සභාපතිතුමනි,

[සභාවේ ඝෝෂා]

**ගරු රෙහෙන්සිරි වරාගොඩ**
Hon. Rehensiri Waragoda

මොන රීතියක්ද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

වරප්‍රසාද ප්‍රශ්නයක් එතුමා ඉදිරිපත් කළේ.

**ගරු රෙහෙන්සිරි වරාගොඩ**
Hon. Rehensiri Waragoda

එහෙම බැහැ. මොකක්ද මේ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, පොඩි අතපසු වීමක් වෙලා තියෙනවා.

[සභාවේ ඝෝෂා]

මීට පෙර අවස්ථාවකදී ආණ්ඩු පක්ෂයෙන් ගෙනාවා මේ වගේ යෝජනාවක්. අපි අපේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ, නැහැ මන්ත්‍රීතුමා වරප්‍රසාද කියන්නේ ඕක නොවෙයි. ඔබතුමාගේ වරප්‍රසාද කඩවීමක් නැහැ. ඔබතුමා වාඩි වෙන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු රෙහෙන්සිරි වරාගොඩ**
Hon. Rehensiri Waragoda

ඔබතුමාලගේ නොහැකියාව.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ, නැහැ වරප්‍රසාද ප්‍රශ්නයක් නොවෙයි. ඔබතුමාට කිසි වරප්‍රසාද ප්‍රශ්නයක් නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මීට පෙර අපි ඔබතුමාටත් සහයෝගය දුන්නා, ඔය වගේ අවස්ථාවලදී.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මගේ තීන්දුව ප්‍රකාශ කරන්නම්. ඔබතුමාට වරප්‍රසාද ප්‍රශ්නයක් නැහැ එතැන.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒක -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට වරප්‍රසාද ප්‍රශ්නයක් නැහැ මන්ත්‍රීතුමා මේ කාරණය පිළිබඳව.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඔබතුමාටත් අපි මෙවැනි කාරණයකදි සහයෝගය -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ මම තීන්දුවක් දෙන්නම්.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්‍ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මේ යෝජනාව සම්බන්ධයෙන් ඔබතුමාගේ තීරණය දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක තමයි.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්‍ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මේකේ ප්‍රමාදයක් ඇති වෙලා තියෙනවා. ඒ අනුව මීට පස්සේ මේ සභාවේ නියමානුකූලව නීති රීති අනුව -

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

අද ජෝර්ජ්ගේ කට වැහිලා.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්‍ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

කටයුතු කරන්නයි කියන එක මතක් කරනවා. ඔබතුමාගේ කරුණු අපට ඉදිරිපත් කරන්න.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

අද ජෝර්ජ්ගේ කට වැහිලා. කෝ අද ජෝර්ගේ කට?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර නිශ්ශබ්ද වන්න.

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

කිංග් ජෝර්ජ් නොකවුටි වෙලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න. කරුණාකර නිශ්ශබ්ද වන්න. ගරු විපක්ෂ නායක -

**ගරු රෙහෙන්සිරි වරාගොඩ**
Hon. Rehensiri Waragoda

ජෝර්ජ්ගේ සතුටු හිනාව

[ සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඉතින් මයික්‍රෆෝන් Off කරගන්න කෝ? ඔබතුමාලා නිශ්ශබ්ද වන්න කෝ. මගේ තීන්දුව ප්‍රකාශ කරන්න. කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න.

[ සභාවේ ඝෝෂා]

ඝෝෂා කිරීම් කරන්න එපා. මේ ඝෝෂා කිරීම්වල සීමාවක් තියෙනවා. ගරු විපක්ෂ නායකතුමා විසින් රීති අත්හිටුවීමේ යෝජනාවක් ඉදිරිපත් කළා -

**ගරු යූ. ජෝර් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

මෙතැන ඉන්නේ ජගත් අංගගේ මැතිතුමාද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ එතුමාට ඉන්න පුළුවන්.

**ගරු යූ. ජෝර් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ජගත් අංගගේ මැතිතුමාද මේ ඉන්නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ නැහැ. ප්‍රශ්නයක් නොවෙයි.

**ගරු යූ. ජෝර් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ඒ ඉසුරු දේවප්‍රිය මන්ත්‍රීතුමා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ, එතුමාට එතැන ඉන්න පුළුවන්. හැබැයි කථා කරන්න අයිතියක් නැහැ එතුමාට. සභාවේ එතැන ඉන්න පුළුවන් එතුමාට. සභාවේ එතැන ඉන්න පුළුවන් එතුමාට.

**ගරු යූ. ජෝර් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක

Hon. U. George Perera - Chief Opposition Whip

ආ ඉන්න පුළුවන්? වෙන සීට් එකක ඉන්න පුළුවන්ද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පුළුවන්.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

වෙන සීට් එකක ඉන්න පුළුවන්?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පුළුවන්. ප්‍රශ්නයක් නැහැ. ඉන්න පුළුවන්.

[ සභාවේ ඝෝෂා]

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

හොඳයි, හොඳයි. ඒ තීන්දුව ලියා ගන්න.

[ සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර නිශ්ශබ්ද වෙන්න. ඔබතුමා ආසනයට යන්න. නිශ්ශබ්දවෙලා ඉන්න බැරි නම්, ඔබතුමා ආසනයට යන්න. ඉසුර මන්ත්‍රීතුමා කරුණාකර ඔබතුමා ආසනයට යන්න. ඔබතුමාගේ ආසනයට ඔබතුමා යන්න. දෙන්නම යන්න.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ඇයි යන්නේ? ඇයි යන්නේ? ඉන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඉසුර දේවප්‍රිය ගරු මන්ත්‍රීතුමා කරුණාකර ඔබතුමා ඔබතුමාගේ ආසනයට යන්න. ඔබතුමා ආසනයට යන්න, එතුමාට සභාවේ ඒ ආසනයේ ඉන්න පුළුවන්. ගැටලුවක් නැහැ. නමුත් කෑගහන්න බැහැ. ප්‍රකාශ කරන්න බැහැ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ඒ තීන්දුව හැමදාටම ගන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනිවාර්යයෙන් ගන්නවා. අනිවාර්යයෙන් මේ සභාවේ ඒ තීන්දුව මම ගන්නවා. (බාධා කිරීම්) අනිවාර්යයෙන් මේ සභාවේ මම ඒ තීන්දුව ගන්නවා. හරි හරි ඔබතුමා වාඩි වෙන්න.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

මම මේක හැන්සාඩ් ගත කරන්න කියලා ඉල්ලීමක් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කිසි ප්‍රශ්නයක් නැහැ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

මේ තීන්දුව කාටත් ආදර්ශයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න. ගරු විපක්ෂ නායකතුමා විසින් ඉදිරිපත් කරන ලද, රීති අත්හිටුවීමේ යෝජනාව සම්බන්ධයෙන් ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා විරෝධතාවයක් ඉදිරිපත් කළා රීති පිළිබඳව ගැටලුවක් තිබෙනවා කියලා. එතුමා ඉදිරිපත් කරපු -

53 (1) යටතේ විපක්‍ෂ නායකතුමා, එතැනින්ම මෙය ඉදිරිපත් කිරීමේ හැකියාව අහෝසි කරලා තිබෙනවා. ඒ අනුව මෙම යෝජනාව තව දුරටත් අපට සභාවේ විවාදයට ගන්න ඉඩකඩ නැහැ. ඔබතුමා අදහස් කරපු 53 (3) ,

*"න්‍යාය පුස්තකයේ ඇතුළත් වී තිබෙන යෝජනාවල අනුපිළිවෙළ නොඉක්මවා ඒ ඒ සභා රැස්වීම්වල න්‍යාය පත්‍රයට සභා කටයුතු පිළිබඳ කාරක සභාවේද එකඟත්වය මත යෝජනා යම් සංඛ්‍යාවක් ඇතුළත් කළ යුතුය."*

ඒක අපි කලින් රැස්වීම සඳහා න්‍යාය පත්‍රයේ මොනවද දාන්නේ කියන එක යෝජනා කිරීමක්. ඒ නිසා මෙම තීන්දුව අත්හිටුවලා තියෙන්නේ. ඒ නිසා ඔබතුමා ගෙනැල්ලා අත්හිටුවපු යෝජනාව මෙම සභාවේ විවාද කරන්න අවස්ථාව දෙන්න අමාරුයි. දෙන්න බැහැ. මොකද අර විරෝධතාවය නිසා.

[ සභාවේ ඝෝෂා]

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්‍ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

නැහැ, නැහැ අපට උදව් අවශ්‍ය නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ආණ්ඩු පක්ෂය කැමති නම් මට ප්‍රශ්නයක් නැහැ. ආණ්ඩු පක්ෂය සම්බන්ධව -

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්‍ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඒ යෝජනාව ප්‍රතික්ෂේප වුණා නම් අපි ඒක භාර ගන්නවා. ඒක වෙනම දෙයක්. ගරු සභාපතිතුමනි, මම වචනයක් කියන්නම්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ, නැහැ ආයේ ඒක බැහැ.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්‍ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මේ සභාවේ නීතිය, - උදාහරණයක් විධියට අද ප්‍රධාන ඇමතිතුමා, කිත්සිරි කහටපිටිය මන්ත්‍රීතුමාගේ යෝජනාව සම්බන්ධයෙන් එතුමා පිළිතුරු දෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාට බලය දෙන්න පුළුවන්. එතුමා අධ්‍යාපන ඇමතිතුමා. එතුමාට බලය දෙන්න පුළුවන්. ඒක වළක්වන්න බැහැ.

[ සභාවේ ඝෝෂා]

ඇමතිවරයෙකුට ඕනෑ වෙලාවක කථා කරන්න පුළුවන්. මේ සභා රීතිවල තියෙනවා.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්‍ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

පුළුවන් වෙන්නේ කොහොමද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විෂය භාර ඇමැතිවරයාට පුළුවන්. ඒක රීතිවල තියෙනවා. ප්‍රධාන ඇමති ඇතුළු ඇමතිවරුන්ට.

**ගරු යූ. ජෝර් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

අපි එතැන හිටියා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක වෙන ප්‍රශ්නයක්.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්‍ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

හොඳයි, අපි මේ සම්බන්ධයෙන් ඉදිරිපත් කරපු මේ කාරණාව සම්බන්ධයෙන් අද රටේ අධිකරණයට එල්ල වෙලා තියෙන ස්වාධීනත්වය පිළිබඳව,

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ නැහැ, ගරු විපක්ෂ නායකතුමා. විවාදයට යන්න ඉඩ දෙන්න බැහැ.

**ගරු යූ. ජෝර් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

අධිකරණයේ යෝජනාවට කැමති නැහැ. ඔබතුමන්ලා කැමති නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක වෙනම දෙයක්. ඔබතුමන්ලා කරුණාකරලා වාඩි වෙන්න. කරුණාකරලා වාඩි වෙන්න.

[ සභාවේ ඝෝෂා]

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්‍ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඒ නිසා මේ සම්බන්ධයෙන් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මගේ තීන්දුව ප්‍රකාශ කළා.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්‍ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

අපේ විරෝධතාවය අපි ප්‍රකාශ කරලා, අපි මේ සභාවෙන් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා වාඩි වෙන්න.

[ සභාවේ ඝෝෂා]

අංක 1 යෝජනාව, අශෝක ලංකාතිලක ගරු මන්ත්‍රීතුමියට යෝජනාව ඉදිරිපත් කිරීමේ අවස්ථාව.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්. අපේ ජෝර්ජ් පෙරේරා විපක්‍ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා 36 (1) යටතේ කිව්වා, අපි මේ යෝජනාවට විරුද්ධයි කියලා. ගරු සභාපතිතුමනි, මෙතැන ආණ්ඩු පක්ෂය හා විරුද්ධ පක්ෂය මේ අධිකරණය සම්බන්ධව වුණු කරුණු කාරණා පිළිබඳව, කථා කරලා හෙළා දැක්කා. ඒ කියන්නේ අපි එතැන ඉන්නවා. එහෙම තියෙද්දී මෙතුමන්ලා ඒ වාගේ වැදගත් යෝජනාවක්

විධිමත් විධියට ගේන්න නොහැකියාව වහන්න හදන්නේ අපි විරුද්ධයි කියලා. අපේ කිසිම විරුද්ධතාවයක් නැහැ. මෙතුමා උවමනාවෙන්ම මේක කළා කියන එකයි මගේ විශ්වාසය.

[ සභාවේ ඝෝෂා]

ගන්න බැහැ නේ. මෙතුමා බැහැයි කිව්ව නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ එහෙම ගන්න -

**ගරු ප්‍රසන්න රණතුංග –** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

මෙතුමන්ලාගේ නොහැකියාව නේ ? එහෙම නම් ඔබතුමන්ලා ඉල්ලීමක් කරන්න අහිංසක විධියට. එතකොට අපි සලකලා බලන්නම්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අශෝක ලංකාතිලක ගරු මන්ත්‍රීතුමියට යොදා තිබුණු අවස්ථාව.

**ගරු මංජු ශ්‍රී අරංගල –** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

අපි මේ යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපතිතුමා ගත්ත තීන්දුවට විරෝධය පළ කරමින්, අපි නැගිටලා යනවා.

[ සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මූලාසනයේ තීන්දුව, අවසාන තීන්දුවයි.

[ සභාවේ ඝෝෂා]

යෝජනාව ගේනන ගරු මන්ත්‍රීතුමිය. යෝජනාව ගේන්න.

[ සභාවේ ඝෝෂා]

කරුණාකර සභාව නිශ්ශබ්ද වන්න. ගරු මන්ත්‍රීතුමා කරුණාකර නිශ්ශබ්ද වන්න. මට පොඩි පැහැදිලි කිරීමක් කරන්න තියෙනවා. ගරු විපක්ෂ නායකතුමා ඉදිරිපත් කළ යෝජනාව මම ප්‍රතික්ෂේප කළේ, රීතිවල අඩුවක් නිසා. නැත්නම් වෙන හේතුවක් නිසා නොවෙයි. මූලාසනය ඒ තීන්දුව ගත්තේ - ආණ්ඩු පක්ෂයටත් විරුද්ධ පක්ෂයටත් ස්වාධීනව මම ඉන්නේ. මම කිසිම පැත්තක් ගන්නේ නැහැ, සභාපතිතුමා වශයෙන්. මම ස්වාධීනව ඉන්නේ. නමුත් ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා ඉදිරිපත් කරපු ඒ විරෝධතාවය නිසා, මට තවදුරටත් එම යෝජනාව සභාවට විවාදයට ගන්න දෙන්න ඉඩකඩ නැහැ. මම ඒ නිසයි ප්‍රතික්ෂේප කළේ.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා –** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ගරු සභාපතිතුමනි, මම ඒ වෙලාවේ හැදුවේ මුලින් ඒ රීතිය සංශෝධනය කරලා සාකච්ඡාවට ගන්න

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නමුත් මුලින්ම අපි අවස්ථාව

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා –** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ඒකට විපක්ෂය එකඟ වුණේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒගොල්ලෝම එකඟ වුණේ නැහැ ඒකට.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා –** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

විපක්ෂයේ සංවිධායකවරයා යෝජනාව, ඒ වැරදි රීති ස්ථිර කළා. වැරදි රීති රෙගුලාසි සහිතව ඒ යෝජනාව ස්ථිර කළා. ඊට පෙර මට අවස්ථාව දුන්නා නම්, මම ඉල්ලීමක් කරන්න හැදුවේ, සංශෝධනය කරලා ඒ යෝජනාව ගන්න කියලා. එහෙත් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් ඉතින් තීන්දු කරලා අවසානයි. මෙය කිසිසේත්ම ප්‍රතික්ෂේප කළ යුතු යෝජනාවක් නොවෙයි. අශෝක ලංකාතිලක ගරු මන්ත්‍රීතුමිය, සනීප නැහැ නේද ඔබතුමියට? ඔබතුමිය යෝජනාව ඉදිරිපත් කරන්න.

# පෞද්ගලික මන්ත්‍රී යෝජනාව : I
## PRIVATE MEMBERS MOTION: I

## ගොවියන්ට භෝග නිෂ්පාදන කල් තබා ගැනීමට සුදුසු ක්‍රමවේද හඳුන්වා දෙමින් පාරිභෝගිකයන්ට නිෂ්පාදන

## සාධාරණ මිලකට මිලදී ගැනීමට අවස්ථාව සැලසීම

BY INTRODUCING FARMER WITH SUITABLE STRATEGIES TO PRESERVE CROP PRODUCTS, FACILITATING CONSUMERS TO PURCHASE PRODUCTS AT A REASONABLE PRICE

**ගරු අශෝකා ලංකාතිලක**
Hon. Asoka Lankathilaka

ගරු සභාපතිතුමනි, මම ස්තුතිවන්ත වෙනවා, මගේ යෝජනාවේ අවසානයේ පුංචි සංශෝධනයකුත් සමඟයි මම ඉදිරිපත් කරන්නේ. ඉන් පළාත් සභාව, මධ්‍යම රජය හා සියලු පළාත් සභාවලින් ඉල්ලීමක් කරන හැටියට තමයි මේ යෝජනාව මම ඉදිරිපත් කරන්නේ.

*"රට තුළ කෘෂිකර්මාන්තය දියුණු කිරීම සඳහා වත්මන් රජය විවිධ ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කරමින් පවතී. "අපි වවමු රට නගමු", "දිවි නැගුම" හා "පොහොර සහනාධාර ලබා දීම" වැනි ව්‍යාපෘති මගින් ඉහළ එළවළු හා පළතුරු ඵලදාවක් ලැබෙමින් පවතී. ඵලදාව නෙලන කාලයේදී එළවළු හා පළතුරු පහසු මිලකට ලබා ගත හැකි අතර, එම කාලවලදී අතිරික්ත ඵලදාව නිෂ්ප්‍රයෝජන ලෙස විනාශ වන අවස්ථා දක්නට ඇත. එම තත්ත්වය ගොවීන්ට පාරිභෝගිකයන්ට මෙන්ම රටේ සමස්ත ආර්ථිකයට අහිතකර ලෙස බලපායි. එබැවින් ආහාර භෝග නිෂ්පාදන කල් තබා ගැනීම සඳහා සුදුසු ක්‍රමවේද සකස් කර ගොවීන් වෙත හඳුන්වා දීමෙන් ගොවීන්ට සිදු වන පාඩුව මඟහැර වීමටත්, පාරිභෝගිකයන්ට සාධාරණ මිලකට නිෂ්පාදන මිලදී ගැනීමට අවස්ථාව සැලසීමටත් පියවර ගත යුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව මධ්‍යම රජයෙන් සහ සිය ම පළාත් සභාවලින් ඉල්ලා සිටින්නීය."*

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල – අමාත්‍යතුමා**
Hon. Udaya Prabhath Gammanpila - Minister

***[විසින් ස්ථිර කරන ලදී.]***
*[Seconded]*

***සංශෝධිත ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Amended, Question proposed*

[ අ.භා. 12.05 ]

**ගරු අශෝකා ලංකාතිලක**
Hon. Asoka Lankathilaka

ගරු සභාපතිතුමනි, මම හිතන්නේ අපේ රටේ කෘෂිකර්මාන්තය පිළිබඳ යම් යම් ආණ්ඩු යම් යම් කාල වකවානුවලදී ගත්ත තීන්දුවලට විපක්ෂයේ නොයෙකුත් වැරදි පිළිවෙත් නිසා, ඒවා කඩාකප්පල් වෙලා ගියා. විශේෂයෙන් මැතිණියගේ රාජ්‍ය කාලයේ, මේ කෘෂිකර්මාන්තය දියුණු කරන්න, රට කෘෂිකර්මාන්තය අතින් ස්වයං පෝෂණය කරන්න වැදගත් යෝජනා, ක්‍රියා මාර්ග ගත්තා. නමුත් හැම එකටම විරුද්ධවන විපක්ෂය හාල් පොල්ල ගැන කියලා, මිරිස් පොල්ල ගැන කියලා, ඒ කටයුත්ත හරියට කරන්න දෙන්නේ නැතුව ඒ වෙනුවට සම්පූර්ණයෙන්ම කෘෂිකර්මාන්තය විනාශ වන විධියේ ක්‍රම වේදයන් මේ රටට ගෙනාවා. එදා තිබුණු ආණ්ඩුව පරාජය කළේ ඒ වගේ වැදගත් ක්‍රියා කලාපයක් ක්‍රියාත්මක වෙමින් සිටියදී. නමුත් මේ මහින්ද රාජපක්ෂ අතිගරු ජනාධිපතිතුමාගේ රජය මේ සියල්ල පාඩමකට ගෙන ඉතා ක්‍රමානුකූලව කෘෂිකර්මාන්තය කෙරෙහි ජනතාව නැඹුරු කිරීමේ ක්‍රියා පිළිවෙතකට දැන් අවතීරණ වෙලා තියෙනවා. ඒක බොහෝ දුරට සාර්ථක වෙලා තියෙනවා. ගොවියන්ට පොහොර සහනාධාරය ලබා දීම තුළින් කෘෂිකර්මාන්තය කෙරෙහි, වී වගාව කෙරෙහි, නොයෙකුත් කෘෂිබෝග වගාවට දිරි දීම කරලා තියෙනවා. දිවි නැගුම තුළින් ඒවාට තවත් ආධාර ලබා දීලා, උපදෙස් ලබා දීලා ක්‍රමානුකූලව ගෙවතු පවා, පවුල් ඒකකයන්ට ඒ කටයුතු කිරීමට පුළුවන් ආකාරයෙන් දියුණු කරලා දීලා තියෙනවා. ඒ වාගේම දීර්ඝ කාලයක සිට රට තුළ "අපි වවමු රට නගමු" කියන වැඩ පිළිවෙළ ක්‍රමානුකූලව ප්‍රදර්ශනාත්මකව දැනුවත් කරමින්, ඒ කටයුතු හරියට කරපු නිසා අද වනකොට මේ තත්ත්වය බෙහෝම ඉහළින් දියුණු වෙලා තියෙනවා. බස්නාහිර පළාත තුළත් අපේ උදය ගම්මන්පිල ගරු ඇමතිතුමා විශාල ක්‍රියාමාර්ග මේ තුළ අරගෙන නාගරික කෘෂිකර්මය පිළිබඳව හිටපු ඇමතිවරු වගේම මෙතුමා විශාල වශයෙන් ජනතාව දැනුවත් කරමින් පොහොර ටික පවා නිෂ්පාදනය කරගන්නා හැටි උපදෙස් දෙමින් අද නාගරික කෘෂිකර්මයත් බෙහෙවින් ඉහළ තත්ත්වයකට ඇවිල්ලා තියෙනවා. මේ වාගේ යුගයක අපි දැකලා තියෙනවා. යම් යම් කාලවලදී ඵලදාව - මේ සෑම ක්‍රියා මාර්ගයක් නිසාම වී, එළවළු වර්ග, පළතුරු වර්ගවලින් විශාල ඵලදාවක් ලැබෙනවා. මේ කාලය වනකොට තක්කලි කිලෝ 1 ක් රුපියල් 15 යි, රුපියල් 20 යි. අපි ආසයි අඩු මිලට ඒ හැම දෙයක්ම ලැබෙනවාට. ඒ වාගේම නැවුම්ව, අලුත්ව ඒවා පාරිභෝජනය කරන්න අපි කැමතියි. නමුත් මෙතැනදි අපි ගොවියන් පැත්තෙන් වගේම පාරිභෝගිකයන් පැත්තෙන් ද බැලිය යුතුයි. පාර්භෝගිකයෝ මෙතැනට කැමති වුණාට මේ විධියට මේ ක්‍රමයට ගියොත් මේ නිෂ්පාදන කරන අයට මේකෙන් කිසිම ඵලයක් නැතුව යනවා. ඒකෙන් වෙන්නේ, මේ තරම් දූරදර්ශීව මේ ක්‍රියාත්මක කරන දේවල්වලින් ගොවියා සහන ගන්නේ නැතුව, දිරිගන්වන්න බැරිවෙලා තමන්ගේ ඵලදාව කුණු කොල්ලෙට දීලා අධෛර්යමත් වෙනවා. මම හිතන්නේ රජයක් වශයෙන්, පළාත් සභාවක් වශයෙන්, අපි ක්‍රම වේදයන් සකස් කරන්න ඕනෑ, කෘෂිකර්මය නඟා සිටවලා ගොවීන්ට හොඳ ආදායමක් ලබාගන්නවා වගේම, ඒ අය ශක්තිමත් කරමින් පාරිභෝගිකයන්ටත් සහන මිලකට මේවා ගන්න දෙන්න. නමුත් අර කාලෙකට වැඩියෙන් ඵලදාව ඒමෙන් ගොවියාගේ ආර්ථික ශක්තිය අඩුවෙන අතර, තවත් කාලයකදී ඒ ඵලදාව නැති කාලයට පාරිභෝගිකයාට විශාල මිල ගණන් ගෙවන්න වෙලා ගැටලු ඇති වෙනවා. මම හිතන්නේ රජයකට, පළාත් සභාවකට මේක සමනය කරන්න පුළුවන්. අපේ රටේ තවම ආහාර කල්තබා ගැනීමේ විවිධ උපක්‍රම සකස් කරලා තියෙනවා මදියි. ඒ වගේම මේවා කල්තබා ගන්න සීත ගබඩා අපට මදී. ඒ වගේම සාමාන්‍යයෙන් මිලදී

ගන්නා දේවල් ආරක්ෂා කරන්න පුළුවන් ගබඩා මේ ලැබෙන ඵලදාවට ප්‍රමාණවත් වෙලා නැහැ.

ඒක නිසා රජයත් පළාත් සභාත් මේ පිළිබඳ උනන්දු වෙනවා නම් මම හිතන්නේ තක්කාලි මිල අඩුවෙන කාලයට ගොවියාගෙන් සාධාරණ මිලකට ඒක අරගෙන සීත ගබඩාවල තියලා මේක අඩුවෙන කාලයට ලබා දෙන ක්‍රමවේදයක් සකස් කළා නම් පාරිභෝගිකයාත් ගොවියාත් මෙතැන්දී ආරක්ෂා වෙනවයි කියන එක මගේ හැඟීම. ඒ වාගේම ඒ වාගේ කැමවලින් පළතුරුවලින් එළවළුවලින් අතුරු භෝග නිෂ්පාදනය කරන්න පුළුවන්. දැන් තක්කාලි වාගේ දේවල්වලින් සෝස්, චට්නි වගේ දේවල් හදලා ඒවා කල්තබා ගැනීමේ ක්‍රම, විදේශ ගත කිරීමේ ක්‍රම අපට සකස් කරගන්න පුළුවන්. ඒකට අපි ගොවියාව දැනුවත් කරන්න ඕනෑ. එහෙම නැත්නම් අතරමැදි කොටසක් ඒවා මිල දී අරගෙන ඒ වාගේ කර්මාන්තයක් වශයෙන් හරි ගබඩා කිරීමට හරි ශක්තිමත් කරන්නට ඕනෑ. ඒ වාගේම වී වුණත් හැමදාම මිලදී ගන්න කාලේ වනකොට ගොවියා අසතුටු වෙන යම් යම් දේ අසන්නට සිද්ධ වෙනවා. ඒක නිසා ඒ ප්‍රදේශවලත් ගබඩා සංකීර්ණ හදලා ඒවා ක්‍රමානුකූලව පාරිභෝගිකයා අතට යන්න, එහෙමත් නැත්නම් අතිරික්තයක් තියෙනවා නම් ඒවා විදේශ රටවල ඇණවුම්වලට ලබා දෙන්න පුළුවන් ක්‍රම වේදයක් සකස් කරගන්න රජයත්, පළාත් සභාත් එකතුවෙලා යම් යම් ක්‍රියා මාර්ග ගන්නට ඕනෑ. ඒ වාගේම තමයි හුඟක් වෙලාවට සිද්ධ වෙන්නේ, අපිට ගස්ලබු ගෙඩියක්, කෙසෙල් ගෙඩියක් පිරිසිදුව කන්න බැරි අවස්ථා ඇති වෙනවා. මහා ආණ්ඩුව යම් නීති ගෙනත් තිබුණත්, පළාත් සභා ගෙනාවත් මේවා තවම යම් මට්ටමකට ඇවිල්ලා නැහැ. පහුගිය දවස්වල මම අසනීපෙන් ඉන්නකොට අපව

[ ගරු අශෝකා ලංකාතිලක ]

බලන්න එන බොහෝ අය ඔය වාගේ පළතුරු ගෙනාවාම ඇත්තෙන්ම ඒවා ලස්සනට ගෙඩිය තිබුණට කපලා බලනකොට කන්න පුළුවන් තත්ත්වයක් නැහැ. මොකද කාබයිඩ් ගහලා ගැට ඉදවලා තියෙන්නේ. ඉස්සර අපි ගැමියෝ විධියට මට මතකයි අපි පුංචි කාලේ සිංහල අවුරුද්දක් එනකොට අපි කෙසෙල් කැණ වත්තේ පැහිලා තියෙනවා, ඉදෙන්නේ නැහැයි කියලා හිතුණම අපි දුම් ගහනවා. හැබැයි, ඒක පරිසරයටවත් ඇඟටවත් අගුණක් නැහැ. අපි වළක් කපලා ඒක වළලලා කෙසෙල් පරඬැල් දාලා බිලිං කොළ දාලා දුම් පිඹලා අපි ඒක ඉදව ගන්නවා. ඒක කාගෙවත් ඇඟට අගුණයක් නැහැ. එහෙම නැත්නම් ලොකු යකඩ ඇණයක් ගිණියම් කරලා කෙසෙල් කැණේ ඒ නැට්ටට ගහපුවහම මේවා ඉදෙනවා. නමුත් අද ඒවාගේ ක්‍රම නොවෙයි තියෙන්නේ. කාබයිඩ් වගේ ශරීරයට අහිතකර ක්‍රම වගේ මේවා ගැට කාලෙදි ඉදෝලා ජනතාව අතරට යනවා. ගස්ලබු වගේ දේවල්. අද විදේශවලින් ගේන පළතුරු දිහා බලපුවහම ඇපල් ගෙඩියක් කාපුවහම කටේ බිබිලි දානවා. ඇයි ඒ තරම් රසායනික වර්ග. නමුත් අද අපේ රටේ හැදෙන කිලෝ පේර ගෙඩියක්, එහෙම නැත්නම් ගස්ලබු ගෙඩියක් කෙසෙල් ගෙඩියක් හොඳ ක්‍රමයට කන්නට පුළුවන් තත්ත්වයක ඒවා ලබා දෙන්න පුළුවන් නම් වඩා හොඳයි. නියමිත කාලයට පැහිලා, ඒවා ඉදවලා ජනතාව අතරට යනවා නම් මම හිතන්නේ, අපේ දරුවන්ට තියෙන ලෙඩ රෝග හුඟක් අවම කරගන්න අපිට පුළුවන්කම තියෙනවා.

ලංකාව වාසනාවන්ත රටක්. මේ දවස්වල පොඩි නියඟයක් ආවත් අපට කෘෂිකර්මාන්තය කරන්න පුළුවන් හොඳ තෝතැන්නක් ඇති රටක්. ඉතාම සුන්දර රටක්, ඉතාම ලස්සන රටක්. නමුත් අපි විසින්, එක්කෝ රජයේ නීති රීති මදිකම නිසා, නැත්නම් ඉන්න අය මේවා පිළිබඳව සෙවීමේ බැලීමේ යම් යම් ක්‍රමවේදයන්වල, නිලධාරීන්ගේ එහෙම නැත්නම් රජයේ අඩුපාඩු තියෙන නිසා මේ වගේ වස විෂ කන්න වෙනවා. ඒ වාගේම ක්‍රමානුකූලව මේවා එන්නැති නිසා, නියමිත කාලයට ගබඩා කරලා, සීත ගබඩා කරලා ජනතාව අතරට යන්නේ නැති තත්ත්වයන් තියෙනවා. එහෙම නැත්නම් හොඳට පැහිලා අලුත් පළතුරු, හොඳ එළවළු පරිසරය තුළ බෙදාහරින්න තියෙන යම් යම් දුර්වලතාවයන් නිසා, සමහර වෙලාවට හොඳම දේ පාරිභෝගිකයාට නැතිව යනවා. අද පුංචි දරුවන්ට පවා දියවැඩියාව, කොලොස්ටරෝල් මේ වගේ රෝගයන් තියෙනවා. පහුගිය දවස්වල පත්තර කියෙව්වාම අපි අහක දාලා තිබුණු පතෝලවල ගුණ කොපමණද කියන එක - අපි නිකන් කියන්නේ කොන්ද පණ නැතුව වැඩ කරන අයට පතෝලයා කියලා. එහෙම නැත්නම් ගුණත් නැති අගුණත් නැති මිනිස්සු හැටියට හැඳින් වුවා පතෝල නම් කරලා. නමුත් අද පතෝලවල තියෙන ගුණය මොන තරම්ද කියන එක විදේශ රටවල පවා ප්‍රචලිත වෙලා තියෙනවා. තක්කාලි ගෙඩිය පිළිකා නැති කරගන්න, ඒක උයලා කාපුවහම ඒකේ කොලොස්ටරෝල් ප්‍රමාණය අවම කරගන්න පුළුවන් කියන එක අද ජපානය ඇතුළු රටවල් රාශියක පර්යේෂණ කරලා හෙළි කරගෙන තියෙනවා. නමුත් මේ වටිනා නිෂ්පාදන කරන ගොවියා දැනුවත් නොවීම නිසා, වටිනා නිෂ්පාදන කරන ගොවියාව හරියට අවශ්‍යතා අනුව පෙළගස්වන්නේ නැති නිසා සමහර වෙලාවට ඒගොල්ලන්ගේ ඒ භෝග කුණුවෙලා යනවා. සොච්චමක් අතට අරගෙන ඊළඟ වගාව කරගන්න බැරි තත්ත්වයකට පත්වෙනවා. ඒ ක්‍රමයට ගියොත් මම හිතන්නේ අපි දිවි නැගුම දුන්නත්, එහෙම නැත්නම්, අපි වවමු රට නගමු වගේ වැඩ පිළිවෙළිනුත් තේරුමක් නැති වෙනවා. අද බිත්තර ගත්තොත් පහුගිය කාලේ විශාල මිලකට රුපියල් 16 යි 17 යි 20 යි වගේ ගණන්වලට ගියා. විශේෂයෙන්ම අපේ මුස්ලිම් අවුරුදු කාලෙට බිත්තර කුකුල් මස් විශාල මිලකට දුන්නා. නමුත් අද මේ රටේ කුකුල් ව්‍යාපාරය සංවිධානාත්මකව කරගෙන යන නිසා පහුගිය කාලේ අපි හිතපු තරම් බිත්තර ගණන් ගියේ නැහැ. කුකුල් මස් ගණන් ගියේ නැහැ. සාධාරණ මිලකට මිනිස්සුන්ට ගන්න පුළුවන්කම තිබුණා. ඒ මේ රජය ක්‍රමානුකූලව ඒ කටයුතු කරපු නිසා. කුකුල් ව්‍යාපාරය මේ රටේ ඉතාම ඵලදායී ආකාරයෙන් ගෙවල්වල පවා කරන්නට පුළුවන් පසුබිම් ණය ආධාර ලබාදුන් නිසා. අන්න ඒ වාගේ අපි මේ හැම එකක්ම ක්‍රමානුකූල කරලා, හැම අඩුපාඩුවක්ම හොයලා බලලා පළාත් සභා හැටියට, එහෙම නැත්නම් මහා ආණ්ඩුවක් හැටියට වැඩ කරනවා නම්, මීට වඩා අපිට සතුටු වෙන්න පුළුවන්. ඒ වාගේම ගොවියත් දිනුම්, පාරිභෝගිකයත් දිනුම්. ඒ වාගේම අපේ ඵලදාව සුරක්ෂිතව

ආරක්ෂිතව ජනතාව අතරට පත් කරලා ජනතාවටත් ඒකෙන් සහනයක් ලබා දෙන්න පුළුවන්. මම මීට වැඩිය මේ පිළිබඳව දීර්ඝව කථා කරන්න යන්නේ නැහැ. මම සියලුම පළාත් සභාවලින් රජයෙන් ඉල්ලීමක් කරනවා මේ ගබඩා පහසුකම් ඇති කරන්න කියලා.

ඒ වාගේම ශීත කාමර ඇති කරලා දෙන්න. ඒ වාගේම ආහාර කල් තබා ගැනීමේ ක්‍රමවේදයන් පිළිබඳව ජනතාව දැනුවත් කරලා, ආහාර කල් තබා ගන්න පුළුවන් ක්‍රමවේදයන් හඳුන්වලා දෙන්න. එතකොට කෘෂිකර්මයෙන් සර්ව සම්පූර්ණ රටක් හැටියට අපට වැඩ කරන්න පුළුවන් වෙනවා. ඒ වාගේම මේවායේ අතිරික්ත විදේශ රටවලට යැවීම තුළින්, අපට ලොකු විදේශ විනිමයක් උපයා ගන්න පුළුවන් වෙනවා. අතිගරු ජනාධිපතිතුමා ඒ සම්බන්ධව මේතාක් කර ගෙන යන වැඩ පිළිවෙළට ස්තුතිවන්ත වෙමින්, ඒ වාගේම අපේ බස්නාහිර පළාතේ ගරු අමාත්‍යතුමා මේ පිළිබඳව උනන්දුවෙන් වැඩ කිරීම පිළිබඳ ස්තුතිවන්ත වෙමින් මේ අඩුපාඩුත් සකස් කර ගෙන අපි අපේ රට තවත් ශක්තිමත් කර ගනිමුයි කියන ඉල්ලීම කරමින් මගේ අදහස් ප්‍රකාශ කිරීම මෙතැනින් සමාප්ත කරනවා.

[ අ.භා. 12.16 ]

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** - අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු සභාපතිතුමනි, වර්තමාන ජනාධිපතිතුමා බලයට පැමිණීමෙන් පස්සේ කෘෂිකර්මය ප්‍රධාන යුග දෙකකට වෙන් කෙරෙනවා. පළමුවැනි යුගය, 2005 සිට 2010 පළමුවැනි ධුර කාලයේදී එතුමාගේ ඉලක්කය වුණේ, ගොවියා. ඒ නිසා එතුමාගේ ව්‍යාපෘතිය වුණේ අපි වවමු, රට නගමු කියන ගොවියාව ඉහළ නැංවීමේ ව්‍යාපෘතියයි. ඒ ව්‍යාපෘතිය තුළින් ගරු සභාපතිතුමනි, අපි ගොවීන්ට පුරන් කුඹුරක් කරද්දී කෘෂි රසායන ටික නොමිළයේ ලබා දුන්නා. ඇළ මාර්ග ටික හදලා දුන්නා. ඒ වාගේම බිත්තර වී ටික ලබා දුන්නා. ලෝක වෙළඳ පොලේ පොහොර ටොන් එකක මිල රුපියල් 7000/- ක් වෙලා තියෙද්දි, රුපියල් 350 ක මිලට, 95 % ක මිල අඩුවීමක් සහිතව පොහොර ටික ලබා දුන්නා. මේ ඔක්කෝම කරලා අස්වැන්න හදා ගත්තාම සහතික මිලට මිල දී ගැනීමත් කළා. මේ ගොවියාව නගා සිටුවීමේ ක්‍රියාවලිය කරලා ගොවියා ශක්තිමත් කළාට පස්සේ 2010 ආරම්භ කළා, පාරිභෝගිකයා සවිමත් කිරීමේ ක්‍රියාවලිය. ඒ තමයි දිවි නැගුම ව්‍යාපෘතිය.

ගරු සභාපතිතුමනි, අශෝකා ලංකාතිලක ගරු මන්ත්‍රීතුමිය ඉතාම නිවැරදිව මතක් කළා වාගේම, අද අපි කන්නේ වස විෂ. රසයි රසයි කියලා කන්නේ වස විෂ. අපි අද කන එළවළු, පළතුරුවල විෂ ගුලි හතක් තියෙනවා. මුලින්ම වගා කරද්දි වල් නාශක දාලා බිම සකසා ගන්නවා. ඊළඟට ඒ බීජ පැළ කළාට පස්සේ පැළේ හැදී ගෙන එන කොට දිලීර නාශක දානවා. රසායනික පොහොර දානවා. ඊළඟට කෘමි නාශක දානවා. අස්වැන්න හැදී ගෙන එද්දි අස්වැන්න හොඳින් හදා ගන්න වර්ණ කාරක දානවා. රස කාරක දානවා. කල් තැබුම් දානවා. මෙන්න මේ විෂ ගුලි හත සහිත ආහාර තමයි අපි කන්නේ. ඒ නිසා ගරු සභාපතිතුමනි, අද විශේෂයෙන්ම බස්නාහිර පළාතේ ජනතාවට තමන්ගේ වෘත්තිය මොකක් වුණත්, තමන්ගේ විවේක කාලයේ තමන්ට ඕනෑ එළවළු, පළතුරු ටික වගා කර ගන්න සිද්ධ වෙලා තියෙනවා. මේ නිසා දිවි නැගුමෙන් වසරකට ගෙවතු දස ලක්ෂයක් ගොඩ නැගීමේ ව්‍යාපෘතියක් ආරම්භ කළා. දැන් මොකද වෙලා තියෙන්නේ? එදා ගොවියාගේ නිෂ්පාදන දිහා බලා ගෙන හිටිය පාරිභෝගිකයා අද තමන් වගා කරනවා. මෙහි ප්‍රතිඵලයක් විධියට අද ගොවි නිෂ්පාදනවල අතිරික්තයක් ඇති වෙලා තියෙනවා ගරු සභාපතිතුමනි. මේ අතිරික්තය දෙයාකාරයකට කළමනාකරණය කරනවා.

බටහිර රටවල නම්, නිෂ්පාදනය කරන සමාගම් එකතු වෙලා කථා කරලා තමයි කරන්නේ, අපි මොනවාද වගා කරන්නේ කියලා. ඒ නිසා ඒ රටේ අතිරික්තය පිළිබඳ ප්‍රශ්නය මත වන්නේ නැහැ. අපේ අසල් වැසි ඉන්දියාවේ ආණ්ඩුව මැදිහත් වෙලා, ගොවි සමිති එකතු වෙලා සාකච්ඡා කරලා කුමන වර්ගයක්, කුමන ප්‍රමාණයකින් වගා කරනවාද කියන එක තීරණය කරනවා. ඒ නිසා අතිරික්තය පිළබඳ ප්‍රශ්නයක් ඇති වෙන්නේ නැහැ. ලංකාවේ මේ ක්‍රම දෙකම භාවිතා වන්නේ නැති නිසා, අද අස්වනු නෙලන කාලයට - කාලෙකට ලූණු විසි කරනවා. කාලෙකට තක්කාලි විසි කරනවා. තව කාලයකට කිරිවලින් පළාත නාවනවා. මේ වාගේ ගැටලු ඇති වෙලා තියෙනවා. ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාතේ ලංකාවේ ජනගහනයෙන් සියයට තිහක් ජීවත් වුණත්, කෘෂි නිෂ්පාදනය වන්නේ සියයට පහටත් අඩු ප්‍රමාණයක්. ඒ නිසා අපේ පළාතේ අතිරික්තය පිළිබද ප්‍රශ්නයක් නැහැ. නමුත් මේ රටේ ඒ ප්‍රශ්නය තියෙනවා. ඒකට අපේ අශෝකා ලංකාතිලක ගරු මන්ත්‍රීතුමිය ඉතාම කාලෝචිත යෝජනාවක් ගෙනාවේ. මොකද, ඉල්ලුම් කළමනාකරණයෙන් අපි මේ ප්‍රශ්නය විසඳන්නේ නැත්නම්, අතිරික්තය කල් තියා ගන්න ක්‍රමවේදයක් හදා ගන්න ඕනෑ. දැනට අපේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් කෘෂි ව්‍යවසායක ව්‍යාපෘතිය යටතේ, පළතුරුවලින් ජෑම් හදන්න, කෝඩියල් හදන්න, ඒ වාගේම චට්නි හදන්න, සෝස් හදන්න, රස කැවිලි වර්ග හදා ගැනීමෙන් කල් තබා ගන්නා පුහුණු පාඨමාලා - අපේ ගොවිපලවල් පහක් තියෙනවා සභාපතිතුමනි. ඒ ගොවිපලවල් පහේම ඒවා ක්‍රියාත්මක වෙනවා. ඊට අමතරව ඒ ව්‍යාපෘති කරන්න අවශ්‍ය කරන කුඩා උපකරණ. මඤ්ඤොක්කා පෙති හදන යන්ත්‍රයක් වෙන්න පුළුවන්. ඒ වාගේම ජෑම් හදන්න අවශ්‍ය කරන උපකරණ කට්ටලය වෙන්න පුළුවන්. අපි මේ කෘෂි ව්‍යවසාය යටතේ යෙදිලා ඉන්න ගොවීන්ට නොමිලයේ ලබා දෙනවා, ඔවුන්ව දිරිමත් කරන්න. ඒ විතරක් නොවෙයි. වසරකට වරක් අපි පවත්වන කෘෂිකර්ම ප්‍රවර්ධන සතියේදී තමන්ගේ නිෂ්පාදන වෙළඳපොලට හඳුන්වා දෙන්න ප්‍රදර්ශන පවත්වනවා. මේ වසරේ ගම්පහ, මිනුවන්ගොඩ, කොළඹ, හෝමාගම, කළුතර, හොරණ කියන ආසනවලදී කෘෂි ප්‍රවර්ධන සතිය තියලා, ගොවියා විසින් තමන්ගේ නිෂ්පාදන අතිරික්තය කල් තබාගන්න පාවිච්චි කරන ක්‍රමවේද ප්‍රචලිත කරන්න ඒ අයට අපි අවස්ථාවක් සලසා දුන්නා.

ගරු සභාපතිතුමනි, මේ නිසා අද අපේ කෘෂි අතිරික්තයට බස්නාහිර පළාත විසඳුම් හොයා ගෙන තියෙනවා. නමුත් ජාතික මට්ටමින් අපේ මන්ත්‍රීතුමිය මතු කරන ලද කාරණය අද රටේ ප්‍රශ්නයක් වෙලා තියෙනවා. ඒ නිසා මෙය කාලෝචිත යෝජනාවක්. මෙය සමාජයේ අවධානය යොමු විය යුතු යෝජනාවක් බව සිහිපත් කරමින්, මේ යෝජනාව ගෙන ඒම පිළිබඳ අශෝකා ලංකාතිලක මැතිණියට පිං දෙමින් මා නිහඬ වෙනවා.

***අ.භා. 12.22 ට විවාදය අවසන් විය.***
*General debate came to a close at 12.22 p.m*

***අනතුරුව, ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Accordingly, question put and agreed to.*

# පෞද්ගලික මන්ත්‍රී යෝජනාව : II
PRIVATE MEMBERS MOTION: II

# ගෘහ සේවිකාවන් ලෙස විදේශයන්හී සේවයේ නියුතු ශ්‍රී ලාංකික කාන්තාවන් මුහුණ දෙන හිංසනයන් වැළැක්වීමට විධිමත් පියවර ගැනීම
TAKING PROPER STEPS TO PREVENT VIOLENCE FACED BY SRI LANKAN WOMEN EMPLOYED IN ABROAD A HOUSE MAIDS

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු සභාපතිතුමනි, *"විදේශ විනිමය වැඩි වශයෙන් අප රටට ගලා එන්නේ විදේශ රැකියාවන්හි නියුක්තවූවන් හරහා වන අතර, එයිනුත් ගෘහ සේවිකාවන් ලෙස සේවය කරනු ලබන කාන්තාවන්ගෙන් වඩා වැඩි දායකත්වයක් ඊට ලැබේ. ගෘහ සේවිකාවන් ලෙස විදේශගත වන කාන්තාවන් නිරන්තරයෙන් විදේශයන්හිදී ගෘහස්ථ හිංසනයන්ට ලක්වීමේ අවදානම් තත්ත්වයට විසඳුමක් ලෙස මහින්ද චින්තන ඉදිරි දැක්මට අනුව ජාත්‍යන්තරව පිළිගත් පුහුණුවකින් පසුව රජයේ අනුමත විදේශ රැකියා සපයන ආයතන හරහා මොවුන් යොමු කිරීමට සෑම විටම කටයුතු කරන ලෙසත් එමෙන්ම එලෙස ගෘහ සේකාවන් හිංසනයට ලක්වීමේ ප්‍රවණතාවය වැඩි රටවල්වල රැකියා සඳහා යොමුවීම අත්හිටුවන ලෙසත් මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව රජයෙන් ඉල්ලා සිටියි."*

**ගරු ජානක සූරියබණ්ඩාර**
Hon. Janaka Sooriyabandara

***[විසින් ස්ථිර කරන ලදී.]***
*[Seconded]*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

[ අ.භා. 12.25 ]

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු සභාපතිතුමනි, මම ඇත්තටම ගොඩාක් වේලාවට මෙම යෝජනාව පළාත් සභාවට ඉදිරිපත් කරන්න හේතු වුණේ දිනෙන් දින මාධ්‍යවලින්, විශේෂයෙන් පුවත්පත් බලන විට අපට දකින්න ලැබෙන දෙයක් තියෙනවා. අපේ ජාතිය කියන්නේ, ගොඩාක් වෙලාවට හොඳ ඉතිහාසයක් තියෙන, හොඳ ප්‍රෞඪ ජාතියක්. පැහැදිලිවම අපි කවදාවත් එක එක රටවල්වල වළං හෝදපු ජාතියක් නොවෙයි. ඒ කෙසේ වෙතත් අද අපි බොහොම ආඩම්බරයෙන් කියනවා, අපට විදේශ විනිමය වැඩි වශයෙන් ලැබෙන්නේ විදේශ රැකියාවල නියුක්ත වූවන්ගෙන් කියලා. ඒකෙත් විශේෂ හේතුව තමයි, අද ගෘහ සේවිකාවන් හැටියට වැඩ කරන අයගෙන් තමයි අපට මේ විදේශ විනිමය ලැබෙන්නේ කියලා බොහොම ආඩම්බරයෙන් අපි සියලු දෙනා සඳහන් කරනවා. ඒ කෙසේ වෙතත් ගරු සභාපතිතුමනි, අපි දැකපු දෙයක් තියෙනවා. අද මේ රටේ විදේශ රටවල්වලට යන ගෘහ සේවිකාවන් නොයෙකුත් ගෘහස්ථ හිංසනයන්ට ලක් වෙනවා. මොකද අපි දැක්කා, ගෘහස්ථ හිංසනයන් වාගේම ඒ තුළින් මරණයට පවා පත් වෙන අවස්ථා වැඩි බව. මෑත කාලයේදී පත්තරවල ගිය දේවල් බැලුවාම, ඒවායේ විශාල ප්‍රමාණයක් බොහෝ වෙලාවට සඳහන් වන්නේ මැද පෙරදිග ගෘහ සේවිකාවන්ට,

*"හර්ෂනීගේ මරණයට හේතුව තවමත් රහසක්."* මේ පුවත්පත්වල සඳහන් වුණු ඒවා. විදේශ රැකියාවට ගොස් නැවත පැමිණි බව කියන,

*"තිස්මඩ එක්දරු මව ගැන තවමත් තොරතුරක් නැහැ."* ඒ වාගේම,

*"අරාබියේ මියගිය කතගේ දේහය ගෙන කොස්ගමදී පිරිස උද්ඝෝෂණයේ."* මේ ලිපිය බැලුවාම පැහැදිලිව තියෙනවා, තමන් යවපු ඒජන්සියට ගිහිල්ලා තියෙනවා. එතැනින් උත්තර නැහැ. මේ ආයතනවලින් කිසිදු සොයා බැලීමක් කරන්නේ නැහැ.

*"ගෙයක් හදා ගන්න සල්ලි සොයා අරාබි මාළිගයක වැඩට ගිය එක් දරු මව යළි ආවේ මිනී පෙට්ටියෙන්."*

*"හාම්පුතාගෙන් පහර කෑ සවුදියේදී මිය ගිය මවගේ සිරුර ගෙනැවිත් දෙන්නැයි දරුවෝ ඉල්ලති."*

*"අරාබියේ මිය ගිය කතගේ සිරුර ශ්‍රී ලංකාවට."* මේ වාගේ හිංසනයන්ට ලක් වුණු පුවත්පත් වාර්තා විශාල ප්‍රමාණයක් පළ වුණා. මේවා මේ මෑතක පළවුණු ඒවා.

*"ලාංකික ගෘහ සේවිකාවක් හෘදයාබාධයකින් මැරුණා"* කියලා වාර්තාවක් එක්ක එවලා තියෙනවා. ඒ වාගේම,

*"කුවේටයේ මියගිය ශ්‍රී ලාංකිකයාගේ තොරතුරක් සොයා ගන්න නැහැ."* මේ වාගේ පුවත් විශාල වශයෙන් මෑත කාලයේදී පුවත්පත්වල පළ වුණා. මේ වාගේ ගෘහස්ථ හිංසනයන් පිළිබඳව. සමහර පුවත්පත් අරගෙන බැලුවාම දිවයින පුවත්පතේ පළ වුණු ඒවා අරගෙන බැලුවාම, මේකේ තියෙනවා සභාපතිතුමනි,

*"ඇස්වලට ඇඟිල්ලෙන් ඇන්නා. පහර පිට පහර කෑවා. අවුරුදු දෙකක් තිස්සේ අපා දුක් වින්දා. මට ලංකාවට එන්න වුණේ ඇඳිවත එක්ක විතරයි."* මේවායේ කියල තියෙන දේ අරගෙන බැලුවාම පුදුම හිතෙනවා. ඒ හාම්පුතාලා, අපේ ලාංකිකයන්ව වැඩට ගන්න හාම්පුතාලා මේ දෙන දඬුවම. අපි උජාරුවට කථා කළාට, අපට විදේශ විනිමය ගේන්නේ මේ ගෘහස්ථ සේවයෙන් කියලා කිව්වාට මේ අය අපා දුක් විඳලා තමයි මේවා අපේ රටට එවන්නේ. මේ ලිපියේ සමහර තැන්වල තියෙනවා,

කුමාරිහාමි කියන ඒ තැනැත්තිය අරාබියේ ඒ ගෙදර සේවය කරන කොට ඇස්වලට ඇඟිලිවලින් ඇනලා, ඇස්වලින් ලේ එනකොට බෙහෙත් දාන්න කිව්වාම එයාට කරලා තියෙන්නේ, තේ කහට අරගෙන ඇස් දෙකට වත් කරලා. ඒ විතරක් නොවෙයි. ඒ ගෙදර දරුවා තමන්ට හිතුණු වෙලාවට ඇදලා අරගෙන කොන්ඩේ කපලා දානවලු. කොන්ඩේ උදුරනවාලු. අපේ ජාතිය ගිහිල්ලා වෙන රටවල්වල මේ විධියේ අපා දුක් විඳිනවා. මම හිතනවා, සියලු දෙනා මේ පුවත්පත් බලන කොට මේවා දකිනවා ඇති. මේවාත් එක්කම,

*"අන්තිමට අම්මාගේ කටහඬ ඇහුනේ සීයාගේ මළගම දවසේ. පුතා හඬා වැලපෙමින් කියයි."* ඒ කියන්නේ අවසානයේ කථා කළා විතරයි. ඊට පස්සේ ආවේ පෙට්ටියක. මේකෙත් පැහැදිලිව කියනවා, ගරු සභාපතිතුමනි. මේ වුණු සිදුවීම් සියල්ල කියනවා, ඒ ගෙදරදී වධ හිංසා දීපු හැටි. ඒ වධ හිංසා දුන්නාට පස්සේ තමන් යවපු ඒජන්සියට ගිහිල්ලා කිව්වාම ඒජන්සියෙන් කියලා තියෙනවා, අපට කරන්න දෙයක් නැහැයි කියලා. ඊට පස්සේ අදාළ ආයතනවලට ගියාම ගෙන්වලා දෙන්නම් කිව්වාට මාස ගණන් රස්තියාදු වෙලා තියෙනවා. මෙන්න මෙහෙම වධ හිංසාවලට ලක් වෙන අය තමයි ඒ රටවලට ගිහිල්ලා අද සේවය කරන්නේ.

ඒ වාගේම ගරු සභාපතිතුමනි මම ඉල්ලා සිටින්නේ, විශේෂයෙන්ම අපි විදේශ සේවා නියුක්ති කාර්යාංශය හරහා මේ එක එක විදේශ රටවල්වලට ගොඩාක් වෙලාවට ශ්‍රමිකයන් යවනවා. ඒ වාගේම එක් එක් ආයතන හරහා යවනවා. මේ ආයතන ලියාපදිංචි කළාට ඒ ආයතනවල කිසිම වගකීමක් නැහැ. අපට ගොඩාක් වෙලාවට අත්දකින්න ලැබෙනවා. මහජන දිනවලදී සමහර ගෘහ සේවිකාවන් හැටියට ගිය අයගේ පවුල් අපි ගාවට එනවා. අපි ගාවට අවාම හතර වටේම තිබෙන ආයතනවලට අපි කථා කරනවා. කථා කළාට, මේ අය යැව්වාට පස්සේ එතැනින් එහාට මෙයා ගැන හොයන්නේ නැහැ. මේවා ගැන හොයන්නේ නැතුව - අද ඒ අය පොඩි දුකක් නොවෙයි විඳින්නේ. මම මේ රජයෙන් ඉල්ලා සිටින්නේ පැහැදිලිවම, මේ ලියාපදිංචි කළාට විතරක් මදී. මේ අයට වෙනම නීති රීති පනවන්න ඕනෑ. තමන් යවන එක්කෙනා ගැන පසුවිපරමක් කරන්න ඕනෑ. පසුවිපරමක් කරලා ඒ අය දුක් විඳිනවාද? මේ අය මොකද කරන්නේ? කියන එක හොයා බලන්න ඕනෑ. එහෙම නැති ආයතන පිළිබඳව දැඩි නීති පනවලා මේවාට වැඩ පිළිවෙලක් හදන්න ඕනෑ. නැත්නම් ගරු සභාපතිතුමනි, අපේ ලාංකිකයන් දිගින් දිගටම දුක් විඳින තත්ත්වයක් තියෙන්නේ.

ඒ වාගේම ගරු සභාපතිතුමනි, මෙහි අනෙක් පැත්ත තමයි, ඒ අය අපා දුක් විඳිනවා වාගේම, ඒ අය මරණයට පත් වෙනවා වාගේම, ඒ විදේශ රටවල්වලට අපේ මව්වරු ගියාට පසුව පුදුම විධියට අද ඒ පවුල් අනාථ වෙනවා. පවුල්වල දරුවන් අනාථ වෙනවා. අද ඒ වාගේ සිදුවීම් ගණනාවක් තියෙනවා. මේ මෑතකදී පළ වුණු,

*"මව්පිය සෙනෙහස අහිමි වූ සුපිරි පාසල් ශිෂ්‍යාව ගණිකා වෘත්තියේ"* මේ සුපිරි පාසල් ශිෂ්‍යාව ගණිකා වෘත්තියේ කියන මේ ලිපිය කියවලා බැලුවාම අවසානයේ තියෙන්නේ, ගරු සභාපතිතුමනි,

*"අම්මා විදේශගත වෙලා. බිරිය යළි නොපැමිණීම නිසා සිත් තැවුලට පත් ස්වාමි පුරුෂයා දුම්රියට පැනලා"* ඒ කියන්නේ ඒ පවුල සම්පූර්ණයෙන් අනාථයි. දරුවෝ ඉන්නවා. අම්මා රට අනාථ වෙලා. අම්මා නොපැමිණි නිසා තාත්තා දුම්රියට පැනලා.

*"බිරිය නොදන්වා රට ගිහින්. සැමියා දරු දෙදෙනාට වස පොවා තමනුත් වස බීලා."* ඉතින් මේ වාගේ තත්ත්ව අද තියෙනවා.

*"එකම පවුලේ දරුවන් පස් දෙනෙක් කඩුගන්නාවේ ටකරන් මඩුවක."* මේවා හොයලා බැලුවාම අවසානයේ ගරු සභාපතිතුමනි, මේ දරුවන් පස් දෙනෙක් ටකරන් මඩුවේ ඉන්නේ. අම්මා රට. ටකරන් මඩුවකට දාලා තාත්තා ගිහිල්ලා වෙන කෙනෙක් එක්ක.

*"බාල වයස්කාර දරුවන් දෙදෙනෙකුට නැන්දාගෙන් කෲර වධ හිංසා."* මේ ෆොටෝ ටික අරගෙන බැලුවාම දුක හිතෙනවා. මේ දරුවන් තුන් දෙනා අපා දුක් විඳලා තියෙන්නේ වෙන හේතුවක් නිසා නොවෙයි. අම්මා විදේශගත වීමත් එක්ක. පියා බිරිය හා දරුවන් අතහැරලා - මෙතැනත් මව රට ගිහිල්ලා.

*"දියණිය ත්‍රීවීල් රියදුරෙකුගෙන් අතවරයට පත් වෙලා."*

"*දොළොස් හැවිරිදි දියණිය කෙළෙසූ පියා වසර පහළොවක් හිරේට.*" ඒ කියන්නේ මව රට ගියා. පියා දරුවන් දෙන්නාම දූෂණය කළා. මේ වාගේ සිදුවීම්.

"*අනියම් බිරියට එපා වූ දරුවා ත්‍රීරෝද රියක දමා ගිහින්.*" අම්මා රට ගිහිල්ලා. තාත්තා වෙන කෙනෙක් බැන්දා. මේ දරුවාව එපා වුණා. ත්‍රීවීල් රථයක දාලා ගියා. මේ වාගේ විශාල වශයෙන්,

"*රිදිගම අසූ හැවිරිදි මල් වෙළෙන්දෙක් දැරියන් තිදෙනෙක් අපයෝජනය කරලා.*" මේ දරුවෝ දෙදෙනාගේම අම්මලා රට. මම මේ ලිපි කියෙව්වාම අවුරුදු අසූවක කෙනෙක් තමයි මේ කතන්දරේට හවුල් වෙලා තියෙන්නේ.

"*සරුංගලේ යවන්න පස්සෙන් පස්සට ගියා. වහලෙන් බිමට වැටුනා.*" මේකෙත් අවසානයේ අරගෙන බැලුවාම අම්මා රට. මේ වාගේ අග හිඟකම් නිසා අම්මා මැද පෙරදිග. "*අනේ, අපේ දුප්පත් පවුලේ මල්ලී අපට අහිමි වුණා.*" මේකෙත් වෙලා තියෙන්නේ, අමමා රට ගියා. මල්ලී සරුංගල් අරින්න ගිහිල්ලා ජීවිතේ නැති වුණා. මේකෙන් හැම තැනින්ම පෙන්නුවේ, අම්මා කෙනෙක් දරුවන් ළඟ ඉන්නවා නම් - අම්මා කෙනෙක් දරුවන් ළඟ හිටියේ නැති වුණාම දරුවෝ අනාථයි. අපි කොපමණ දරුවන් හොඳට හැදුවත්, දරුවෝ කිහිප දෙනෙක් හරි හොඳට හැදුනේ නැත්නම් මේ සමාජයෙන් විනාශ වෙනවා. ඒකට ප්‍රධාන හේතුව තමයි, මව දරුවන් අතර නැති වීම. මේකත් එක්කම අපි දැකලා තියෙනවා ගරු සභාපතිතුමනි. ඒ වාගේම දැඩි නීති ගේන්න ඕනෑ දෙයක් තියෙනවා. අපේ රටෙන් විදේශගත වෙලා අපේ රටේ නම කෙළෙසන අය ඉන්නවා. අන්න ඒ අයට අපි දැඩි නීති රීති ගේන්න ඕනෑ. අපේ රටේ ගෞරවයට හානි කරන ඒවාට.

[ ගරු ලලිත් එල්ලාවල ]

ඒ එක්කම ගරු සභාපතිතුමනි, මම ඉල්ලා සිටින්නේ අපි දැක්කා. සමහර පත්තරවල තිබුණා, අරාබියේ අතරමංව සිටි 114 දෙනෙක් මව් බිමට. මේ එකසිය දාහතර දෙනා කියලා කියන්නේ ගරු සභාපතිතුමනි, පවුල් එකසිය දාහතරක්. ඒ වාගේම වසර දාහතක් සෞදියේ රඳවා ගෙන සිටි ගෘහ සේවිකාව යළි මව් බිමට. මේ ලිපිය කියවලා බැලුවාම වසර දාහතක් සෞදියේ වැඩ කරලා තියෙනවා. නමුත් ගරු සභාපතිතුමනි, වසර දාහතක් වැඩ කළත් එයාට ගෘහ සේවිකාවක් හැටියට තමන්ට පඩියක් හම්බ වෙලා නැහැ. වධ හිංසා විතරයි හම්බ වෙලා තියෙන්නේ. සමහර වෙලාවට අපි හොඳ තැනුත් දැක්කා. සමහර වෙලාවට සභාපතිතුමනි, මෙහි ප්‍රධාන වශයෙන් ඩිලාන් පෙරේරා ගරු ඇමතිතුමාගේ ලිපියක් මේ මෑතකදී තිබුණා, ජෝර්දානයට ශ්‍රී ලාංකික ගෘහ සේවිකාවන් යැවීම ගැන ලබන සතියේ සාකච්ඡාවක්. ඒ ලිපියේ කියලා තියෙනවා ජෝර්දානයේදී මේ වාගේ වැඩිපුර වධ හිංසා ඇති වන නිසා මේ ගැන සාකච්ඡා කරලා තීන්දුවකට එනවා කියලා. සමහර තැන්වල කියලා තියෙනවා, සිංගප්පූරුවේ ගෘහ සේවයට කාන්තාවන් යැවීම නවත්වන්න, ළමා ආරක්ෂණ අධිකාරිය ඉල්ලයි. ළමා ආරක්ෂණ අධිකාරියටත් අද තේරිලා තියෙනවා මේ කාන්තාවන් යැවීම තුළ තමයි ගොඩාක් වෙලාවට මේ දරුවන් අපයෝජනයට ලක් වෙන්නේ කියලා.

මේ එක්කම අනෙක් පැත්ත තමයි, සමහර රටවල්වල ආරක්ෂාවට තියාගන්න තැන්. අපේ අතරමං වුණු කාන්තාවන්ව සමහර රටවල්වල ආරක්ෂාවට තියා ගන්නවා. "කුවේටයේ ස්වේච්ඡා නිවහනට එන ශ්‍රී ලාංකික කතුන් විකිණීමේ ජාවාරමක්." ඒ කියන්නේ තමන්ගේ ආරක්ෂාවට එන තැනත් තමන්ට ආරක්ෂාව නැති තැනට ඇවිල්ලා. ඒ තැන්වල ආරක්ෂාව නැති තැනට ඇවිල්ලා. ඒ තැනට ආවාමත් අපේම අය ඒ මව්වරුන්ව විකුණන තැනට අද ඇවිල්ලා තියෙන සමහර තැන් තියෙනවා. මේවාගේ විශාල සිද්ධීන් ප්‍රමාණයක් ගරු සභාපතිතුමනි, මෙම පුවත්පත්වල පළ වුණා. ඉතින් මම ඉල්ලා සිටින්නේ මෙපමණයි. මෙන්න මේ රටේ මේ වාගේ ඒජන්සි පිළිබඳව තීන්දුවක් ගන්න ඕනෑ, මේවායේ ලියාපදිංචි වුණත් අපේ විදේශ විනිමය ගේන අපේ මව්වරු යැව්වා විතරක් නොවෙයි. පසු විපරමක් කරන්න ඕනෑ. ඒ අයට යම් වධ හිංසාවක් දෙනවා නම්, ඒ අය එහෙම දෙයකට පෙළඹෙනවා නම් ඒ ආයතනය සම්පූර්ණයෙන් වග කියන්න ඕනෑ තැනට කටයුතු කරන්න ඕනෑ.

ඒ එක්කම මම ඉල්ලා සිටින්නේ, අපේ තානාපති කාර්යාල වුණත් අපේ රටේ ජනතාව ගැන මීට වඩා බලන්න ඕනෑ කියලයි. මම එහෙම කියන්නේ ගරු සභාපතිතුමනි, ගොඩාක් වෙලාවට මහජන දිනවලදී අපි මේ ප්‍රශ්නවලට මැදිහත් වෙනවා. අවුරුදු ගණන් මැදිහත් වුණු ඒවා තියෙනවා. තාම උත්තරයක් නොලැබුණු තැන්. ඒ නිසා ගරු සභාපතිතුමනි, අන්න ඒ නිසයි මම කියන්නේ, මේ පිළිබඳ වගකිව යුතු ආයතන මීට වඩා මැදිහත් වෙන්න ඕනෑ. මීට වඩා මැදිහත් වෙලා මේ අයට ආරක්ෂාව සලසන්න ඕනෑ. නැත්නම් අපි ආඩම්බරයෙන් කිව්වාට වැඩක් නැහැ, විදේශ විනිමය ගේන්නේ ගෘහ සේවිකාවන් කියන එක. ඒ ගෘහ සේවිකාවන් ගේනවා නම් ඒ පවුල්වල විශේෂයෙන්ම ඒ කාන්තාවන් රට ගියාට පස්සේ, ඒ අම්මා රට ගියාට පස්සේ ඒ දරුවන්ට කෙරෙන වැඩ පිළිවෙළ මොකක්ද කියලා බලන්න ඕනෑ. එහෙම නැතිවුණොත් අපේ සමාජය කොපමණ ඉස්සරහට ගන්න හැදුවත්, කොපමණ ගුණ ගරුක සමාජයක් කරන්න හැදුවත් මේක ඉදිරි අනාගතයේදී අපට බලපානවා ගරු සභාපතිතුමනි. අන්න ඒ හේතුව උඩයි මම මේක මේ සභාවට ඉදිරිපත් කළේ. ඒ නිසා මම නැවත නැවතත් මෙම සභාවෙන් ඉල්ලා සිටින්නේ, මේ සම්බන්ධව දැඩි නීති රීති පනවලා අපේ අතිගරු ජනාධිපතිතුමා, මහින්ද රාජපක්ෂ මැතිතුමා මහින්ද චින්තන වැඩ පිළිවෙළ යටතේ හොඳ වැඩ පිළිවෙළක් ඉදිරිපත් කරලා තියෙනවා. ඒ වැඩ පිළිවෙළ තව තවත් ක්‍රියාත්මක වන වැඩ පිළිවෙළක් ලෙස ගේන්න කියලා රජයට යෝජනා කරන්න තමයි මම මේ යෝජනාව ඉදිරිපත් කළේ. බොහොම ස්තුතියි ගරු සභාපතිතුමනි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. ජගත් අංගගේ ගරු ඇමතිතුමා. ඔබතුමාට අවස්ථාව.

[ අ.භා. 12.40 ]

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

ගරු සභාපතිතුමනි, ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවට මෙම සභාවේදී අදහසක් ප්‍රකාශ කරන්නට අවස්ථාව ලබා දීම සම්බන්ධව මා ඔබතුමාට මගේ ස්තුතිය ප්‍රථම කොට ප්‍රකාශ කරන්න කැමතියි. ගරු සභාපතිතුමනි, බස්නාහිර පළාතේ සමාජ සේවා විෂය භාර අමාත්‍යවරයා හැටියට මේ විදේශ රැකියා සඳහා මව්වරුන්ගේ ප්‍රවේශය පිළිබඳව යම්කිසි අදහසක් අප මතු කරගත යුතු අවස්ථාවක් හැටියට මා විශේෂයෙන්ම, මෙය අගය කොට සලකනවා. ඕනෑම ක්‍රියාවක් ක්‍රියාවට නැංවීමේදී ඒ තුළින් මතුවන අතුරු ඵල පිළිබඳවත් අපි යම්කිසි මට්ටමක අධ්‍යයනයක යෙදිය යුතුයි කියලා මා හිතන විධියට විද්‍යාත්මක පදනම මත පිහිටලා හිතනවා නම්, එය සිදුවිය යුත්තක්. විශේෂයෙන්ම විදේශගතව තමන්ට තියෙන ආර්ථික ප්‍රශ්න විසඳා ගෙන පවුල යහපත් මගකට ගන්න. ආර්ථිකයෙන් පෝෂණය වුණු තත්ත්වයකට පත් කර ගන්න ශ්‍රී ලංකාවේ කාන්තාවන් අතිශය වශයෙන්ම තමන්ගේ සමාජීය ප්‍රශ්නවලදී පිළිතුරු වශයෙන් සොයා ගන්නා කාරණාවක් මෙය. ඒහෙත් ගරු සභාපතිතුමනි, පසුගිය දවස්වල බස්නාහිර පළාතේ පවුල් අර්බුදකාරී තත්ත්වයන්, පවුල් කුටුම්බයේ බිඳ වැටීම් පිළිබඳව විවිධ මට්ටමේ විද්වතුන්ගේ අදහස් විමසීමේදී මේ ප්‍රශ්නය පිළිබඳව ගැඹුරු අධ්‍යයනයක යෙදෙන්නට අපට අවස්ථාවක් ලැබුණා. දරුවන්ගේ ප්‍රශ්න විසඳා ගන්න, තමන්ට ජීවත් වෙන්න සුදුසු නිවහනක් තනා ගන්න දහසකුත් සිහින අතරේ විදේශ රටවලට යන කාන්තාවන්ගෙන් සියයට වැඩි ප්‍රමාණයක් නැවත ආපසු මේ ලංකාවට එන්නේ මහා දැවැන්ත ප්‍රශ්න රාශියකට මැදි වෙලා. සමහරක් වෙලාවට ආර්ථික වශයෙන් ස්වයංපෝෂිත වෙලා ලංකාවට එන කොට පවුල විනාශයට පත් වෙලා. දරුවන් අයාලේ ගිහිල්ලා. තමන්ගේ ස්වාමියා වෙන අතක ගිහිල්ලා. ඇයට ලංකාවට ඇවිල්ලා කර ගන්න දෙයක් නැති තරමට විනාශයට පත් වෙලා. ඒ මුදලේ ශත පහක වටිනාකමක් නැති වෙනවා. තව කෙනෙකු විදේශ රැකියාවකට ගිහිල්ලා, තමන් ගිය රටේදි තමන්ට නොගැළපෙන ස්ථානයක් හමු වෙලා ඒ ස්ථානයේදී තමන්ගේ ජීවිතය සමස්තයක් වශයෙන් විනාශයට පත් වෙලා කර කියා ගන්න දෙයක් නැතිව අසරණ භාවයට පත් වෙනවා. එසේත් නැත්නම්, මේ යන ගමනේදී ඇය ශ්‍රී ලංකාවේ සංස්කෘතියට සම්ප්‍රදායට නොගැළපෙන තත්ත්වයට පත් වෙලා මේ ලංකාවට නැවත එනවා.

මෙවැනි විවිධාකාර වූ ගැටලු රාශියක් මැද්දේ තමයි අද ශ්‍රී ලංකාවේ ඉඳලා විදේශ රටකට ගෘහ සේවිකාවක් හැටියට යන විශේෂයෙන්ම කාන්තාවන් මේ ශ්‍රී ලංකාවට නැවත එන්නේ. සමහරක් අය ජීවිතක්ෂයට පත් වෙනවා. සමහරක් අය සිය දිවි හානි කර ගන්නවා. මේ ප්‍රශ්නයට නිවැරදි විසඳුමක් සොයා ගැනීමේදී මා හිතන්නේ ආර්ථික ප්‍රශ්න ගැන විතරක් බලලා මේ ප්‍රශ්නයට පිළිතුරු හොයන්න බැහැ. විසඳුම් සොයා ගන්න අපහසුයි. මේ විදේශගත රැකියාවන් සඳහා මෙහි සිටින ඒජන්සිකරුවන් විශාල වශයෙන් සිටිනවා. ඔවුන්ට කිසිම අවශ්‍යතාවයක් නැහැ. ඔවුන්ට අවශ්‍ය මුදල් පමණයි. යම්තම් මෙතැනින් මුහුදෙන් එහා පැත්තට යවා ගත්තොත් එහෙම තමන්ට අවශ්‍ය කරන මුදල අතට ආවා නම් ඔවුන්ගේ ප්‍රශ්නය එතැනින් හමාරයි. නමුත් ශ්‍රී ලාංකීය සමාජයට වන දැවැන්ත විනාශය. මේ පවුල්වල දරුවන්ට, ඒ දරුවන් විතරක් නොවෙයි, අපට පරිසරයට සිදුවන විනාශය පිළිබඳව ගැඹුරින් අධ්‍යයනය කළොත් එහෙම, මේ විදේශගත මුදල අරගෙන එනවාට වැඩිය විශාල විනාශයක් රට තුළ සිදු වෙනවා. මේක අතිශයින්ම ප්‍රමිතිකරණය කළ යුතු කාරණාවක් බවට අද පත් වෙලා හමාරයි. ඒ නිසා ගරු මන්ත්‍රීතුමා මා අදහස් කරන්නේ විදේශ රටකට ගිහිල්ලා රැකියාවක් කර ගෙන ශ්‍රී ලංකාවට එන තත්ත්වය වළක්වාලීම නොවෙයි, මේ ක්‍රියාවලිය විධිමත් කිරීමේ අවශ්‍යතාව පිළිබඳව යම්කිසි සැලැස්මක් මධ්‍යම රජයට යෝජනා කළ යුතුයි කියන අදහස තමයි මා විශ්වාස කරන්නේ. මෙය අත්‍යවශ්‍යයෙන්ම සිදුවිය යුත්තක් හැටියට අප සලකන්නේ, පරිවාස භාරයට පත්වන දරුවන් පිළිබඳව සැලකිල්ලට ගත්තොත් එහෙම. අද අධිකරණයෙන් පරිවාසයේ රැකවරණය සලසන දරුවන්ගෙන් සියයට අනූවක් මෙවැනි ප්‍රශ්න නිසා සමාජයේ අතරමං වූ දරුවන්. විශාල වශයෙන් ගරු සභාපතිතුමනි, අපේ ජීවිතය අපි සාමාන්‍යයෙන් අදහස් කරනවාට වඩා වෙනස් තත්ත්වයකට කාලවිය හයකට කඩා ගන්න පුළුවන්. දරුවෙක් මවකගේ කුස පිළිසිඳ ගත් අවධිය අපි කළලයක් හැටියට සලකලා කළල අවධිය, ළදරු, අවධිය, ළමා අවධිය, තරුණ කාලය, මැදියම් කාලය සහ මහළු විය. කාලවිය හයකට කඩා ගන්න පුළුවන්. දැන් දරුවෙක් තරුණ වියට පත්වන කාල අවධිය ඇහුවොත් හුඟාක් වෙලාවට තරුණ වියට පත් වෙන්නේ, අවුරුදු දහයයි දහසයයි අතර කාලයේදී. අපට නොතේරුණාට පිරිමි ළමයෙක් වෙන්න පුළුවන්. ගැහැණු දරුවෙක් වෙන්න පුළුවන්. මේ දෙගොල්ලම තරුණ වියට පත්වෙනවා. අපි කිව්වොත් එහෙම වර්ගයාගේ පැවැත්ම සඳහා ප්‍රජනන ක්‍රියාවලියට අවශ්‍ය හෝමෝන ක්‍රියාත්මක වන්නේ, අවුරුදු දහයයි දහසයයි අතර කියලා. මේ කාලයේදී තමයි සමාන්‍යයෙන් වැඩිම ලිංගික වින්දනයක් ලබන්න පුළුවන් කාලය හැටියට විද්‍යාඥයෝ පිළිගන්නේ. අපේ සංස්කෘතිය අනුව අධ්‍යාපනය හමාර කරලා රැකියාවක් සොයා ගෙන තමන්ට පෝෂණය වෙන්න පුළුවන් තතත්වයට ආවාට පස්සේ තමයි විවාහ ජීවිතයට ඇතුළත් වෙන්නේ. ඒ අවස්ථාවේදී තමයි සංස්කෘතිමය වශයෙන් නිවැරදි කාලපරිච්ඡේදය උදා වන්නේ. නමුත් අම්මගේ තාත්තගේ රැකවරණය සඳහා වැඩිහිටියන්ගේ රැකවරණයත් එක්ක තමයි මේ සංස්කෘතික බැම්ම තුළ මේ අවධිය පහු කර ගෙන මේ දරුවෝ ඉස්සරහට යන්නේ. නමුත් රැකවරණය නැති වුණාට පස්සේ මේ දරුවන්ට මොකද වෙන්නේ? මේ වන කොට තුන්දහසකට අධික ප්‍රමාණයක් ඉන්නවා ළමා මව්වරු. මේ ළමා මව්වරුන් බිහි වුණේ

කොහොමද? අම්මගේ තාත්තගේ නිවැරදි රැකවරණයෙන් බැහැර වුණු ඒ අහිංසක දරුවෝ. මේ අය ඇවිල්ලා විශාල වැරදි වැඩක් කරපු අය නොවෙයි. ස්වභාව ධර්මයට අවනත වුණු අය. නමුත් ළමා සුරැකුම් මධ්‍යස්ථානයට ගියාම සමහරක් අය මේ දරුවෝ දිහා බලන්නේ නිකම් සත්තු දිහා බලනවා වාගෙයි. සත්තු දිහා බලලා වගේ වැඩක් නැහැ. මේ අපිම කරගත්ත වැරැද්දක් නිසා අසරණ වුණු දරුවෝ ටිකක්. ඒකට වගකිව යුතු පිරිමි දරුවෝත් ඉන්නවා. පිරිමි දරුවෝ පරිවාසගත වෙලා නැහැ. ගැහැණු දරුවෝ ටික පරිවාසගත වෙලා ඉන්නවා.

මේ නිසා මේ සමාජ ප්‍රශ්නවලින් මේ සමාජය මහා විශාල විධියට විනාශයට පත් වන්නේ අපි අපේ වගකීම් පිළිබඳ නිවැරදි අවබෝධයකින් තොරව ක්‍රියාත්මක වන නිසා. ඒ නිසා විශේෂයෙන්ම අම්මාවරු විදේශගත වීමේදී තමන්ගේ පවුල් පරිසරය පිළිබඳ මහා දැක්මක් ඒ අයට තියෙන්න ඕනෑ. ඒ වාගේම සමාජය තුළ විදේශගත කරන ඒජන්තවරුන්ට මහා දැවැන්ත නීති සම්භාරයකින් බැඳ තබන්න ඕනෑ, මේ අයගේ ආරක්ෂාවත් පිළිබඳව. අම්මා අද එයි. හෙට එයි. අනිද්දා එයි කියලා බලාපොරොත්තු වෙනවා. සමහර විට අම්මාට මහ විශාල අතවරවලට පත් වෙන්න වෙනවා විදේශ රටවල්වලදී. අන්තිමට ලංකාවට එන කොට හිස් අතින් එන්නේ. ලංකාවට ආවාම අම්මට දරුවෝත් නැහැ. ස්වාමියත් නැහැ. පවුලත් නැහැ. කිසි දෙයක් නැහැ. පටාචාරාවට වුණු දේ තමයි හුඟාක් අම්මලාට රට ගිහිල්ලා එන කොට මෙහේ අවසානයේදී ඉතුරු වෙන්නේ. ඒ නිසා මා විශේෂයෙන්ම මේ පිළිබඳව අවධානයට ලක් කිරීමට මේ යෝජනාව ඉදිරිපත් කිරීම පිළිබඳව අපේ ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා. මොකද, හේතුව, අද කථිකාවට ලක් විය යුතු සමාජ ප්‍රශ්නයක් නිසා. මා කියන්නේ නැහැ, අසරණ අම්මා කෙනෙක් විදේශගත වන කොට - ඒ අයට ශත පහක්වත් හොයා ගන්න, මේ සමාජය තුළ හවිහරණයක් නැත්නම්, ඒ රටකට ගිහිල්ලා මුදලක් හොයා ගෙන ඇවිල්ලා තමන්ගේ ප්‍රශ්නයක් යම් ප්‍රමාණයකට විසඳා ගැනීම වැරැද්දක්

[ ගරු ජගත් අංගගේ - අමාත්‍යතුමා ]

කියලා මා කියනවා නොවෙයි. නමුත් ඒ තුළින් තවත් ප්‍රශ්න රාශියක් නිර්මාණය වෙනවා නම් ඇයට ඒ උපයන මුදල ශත පහක වටිනාකමක් නැති වෙනවා නම්, මේ සමාජ ප්‍රශ්න නිසා ඒ කරපු පරිත්‍යාගයට වටිනාකමක් නැතුව යනවා. ඒ නිසා විශේෂයෙන්ම අපි මේ පිළිබඳව මොහොතකින් තීන්දුවක් තීරණයක් ගැනීමට එහා ගිහිල්ලා විශාල සමාජ කථිකාවතක් ඇති කර ගෙන විදේශගත වෙලා අපට විදේශ විනිමය රැගෙන එන මේ මව්වරුන්ට රැකවරණය සංවිධානය කිරීමත්, ඔවුන්ගේ පවුල්වලට හානියක් නොවන විධියට සමාජ පසුබිම සකස් කිරීමට සුදුසු කාලය එළඹ තිබෙන නිසා ඒ සඳහා යම් පිළියමකට මගපෙන්වීමක් මේ තුළින් නැගෙනවා නම් මම හිතන්නේ, එය තමයි විසඳුම විය යුත්තේ. ඒ නිසා මම නැවත නැවතත් මේ අවබෝධය තුළින් මේ යෝජනාව ඉදිරිපත් කිරීම පිළිබඳව ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමාට මගේ ගෞරවය සහ ස්තුතිය ප්‍රකාශ කරමින් ඔබතුමාගේ පරමාර්ථය සර්වප්‍රකාරයෙන්ම සාර්ථක වේවා කියලා ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

*අ.භා. 12.49 ට විවාදය අවසන් විය.*
*General debate came to a close at 12.49 p.m*

*අනතුරුව, ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*Accordingly, question put and agreed to.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ලලිත් එල්ලාවල ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ යෝජනාව පිළිබඳ විවාදය මෙයින් අවසන් වෙනවා. ඒ නිසා ඒ පිළිබඳ සභාවේ බෙදීමක් තිබෙනවාද?

ඒ අනුව එතුමා ඉදිරිපත් කළ යෝජනාව සභා සම්මත වූ යෝජනාවක් වශයෙන් මේ අවස්ථාවේ ප්‍රකාශ කර සිටිනවා.

## කල් තැබීමේ යෝජනාව
## ADJOURNMENT

**ගරු ජගත් අංගගේ - අමාත්‍යතුමා**
Hon. Jagath Angage - Minister

ගරු සභාපතිතුමනි, *"දැන් මම මෙම සභාව කල් තබනවා."*

***ඊට අනුකූලව පළාත් සභාව අ.භා. 12.50 ට, 2012 ඔක්තෝබර් මස 23 වන දින පූ.භා. 09.30 වන තෙක් කල් ගියේය.***

*Aaccordingly, the Provincial Council was adjourned at 12.50 p.m. till 09.30 a.m, on 23.10.2012.*